2023



වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

ANNUAL REPORT



රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

அரசகரும மொழிகள் ஆணைக்குழு

OFFICIAL LANGUAGES COMMISSION

වාර්ෂික වාර්තාව - 2023

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

"ජනජයසිටි"ගොඩනැගිල්ල, 09 වන මහල, නාවල පාර, රාජගිරිය.
" ஜனஜயசிட்டி" கட்டடத்தொகுதி, 09 ஆம் மாடி, நாவல வீதி, இராஜகிரிய.
"Janajayacity" Building, 09th floor,Nawala Road, Rajagiriya.
http://olc.gov.lk/

විද්‍යුත් තැපෑල olcommission@gmail.com
மின்னஞ்சல் olc@sltnet.lk
E-Mail

කාර්යාලය
அலுவலகம் 2889482
Office

පටුන

හැඳින්වීම 03

සභාපතිතුමාගේ සමාලෝචනය 04

I කොටස 06-10

1. දැක්ම
2. මෙහෙවර
3. අරමුණු
4. ප්‍රධාන කාර්ය
5. සංවිධාන ව්‍යූහය - 2023/12/31 දිනට රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යූහය
6. කොමිෂන් සභා රැස්වීම්
7. උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම

II කොටස 11-24

1. භාෂා විගණන පැවැත්වීම
2. පැමිණිලි විමර්ශනය
3. අධ්‍යාපනය
4. උපදේශනය
5. ජාතික භාෂා සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතිය (NLEAP)

III කොටස - මූල්‍ය ප්‍රකාශන 25-45

IVකොටස - විගණකාධිපති වාර්තාව 46-52

හැඳින්වීම

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව 1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනත මගින් ස්ථාපනය කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. කොමිෂන් සභාව ජනාධිපතිවරයා විසින් වසර 03ක කාලසීමාවක් සඳහා පත් කරනු ලබන අතර සාමාජිකයන් සය දෙනෙකුගෙන් සමන්විත වේ. (ඉන් එක් සාමාජිකයෙක් කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස ජනාධිපතිවරයා විසින් නම් කෙරේ) **කොමිෂන් සභා පනතෙහි පොදු අරමුණු සතරක් අන්තර්ගත වේ. ඒ අරමුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ ඇතුළත් ප්‍රතිපාදන නියාමනය හා සම්බන්ධ වේ.**

මේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කොමිෂන් සභාව අධීක්ෂණය, විමර්ශනය, අධ්‍යාපනය හා උපදේශනය යන ප්‍රධාන කාර්යයන්ට අදාළ ව වැඩසටහන් ක්‍රියාත්මක කරයි. අධීක්ෂණය යටතේ භාෂා විගණන, ද්විමිරිය ස්ථාන විගණන හා විශේෂිත සමීක්ෂණද විමර්ශනය යටතේ මහජන පැමිණිලි හා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝනය කිරීම සම්බන්ධ ස්වයං විමර්ශන ද අධ්‍යාපනය යටතේ විවිධ පාර්ශවකරුවන් දැනුවත් කිරීම ද උපදේශනය යටතේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය හා සම්බන්ධ නිර්දේශ ලබාදීම ද සිදු කෙරේ.

මේ වර්ෂයේදී පොදු ආයතන 60ක නියැදියක් භාෂා විගණනයට ලක් කරන ලදි. විමර්ශනය අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව 93කි. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය භාවිතා කරමින් භාෂා අයිතිවාසිකම් පිළිබඳ ව මහජනතාව දැනුවත් කිරීම සඳහා වැඩසටහන් 05ක් ක්‍රියාත්මක කරන ලදි. එමෙන් ම මුද්‍රිත මාධ්‍ය දැන්වීම් 03ක් පළ කෙරිණි. තව ද උතුරු මැද, ඌව, වයඹ, සබරගමුව, මධ්‍යම, නැඟෙනහිර සහ උතුර යන පළාත්වල ප්‍රාදේශීය ලේකම් කාර්යාල 251 ක රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන නිලධාරීන් සහ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා මාර්ගගත වැඩසටහන් (Zoom) පවත්වන ලදි. එමෙන් ම පාසල් භාෂා කව වැඩසටහන් යටතේ පාසල් දෙකක නව පාසල් භාෂා කව පිහිටුවන ලද අතර දැනට ක්‍රියාත්මක පාසල් භාෂා කව 03ක් පසු විපරම් කරන ලදී.

රජය සතු ව්‍යවසායකයන් සඳහා වන පොදු යහපාලන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි උපදෙස් පරිදි කොමිෂන් සභාව මඟින් වාර්ෂික වාර්තාවක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එහි අන්තර්ගතය කොමිෂන් සභාවට අදාළ ව සැලකිල්ලට ගෙන මේ වාර්ෂික වාර්තාව පිළියෙල කරන ලදි.

මෙම වාර්ෂික වාර්තාව ප්‍රධාන කොටස් හතරකින් සමන්විත වේ. එනම් කොමිෂන් සභාව පිළිබඳ සාමාන්‍ය තොරතුරු, ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්, 2024 මූල්‍ය ප්‍රකාශන හා විගණකාධිපති වාර්තාවයි. ඉහත කී මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇතුළත් කරුණු මෙම ප්‍රධාන කොටස් හතරෙහි තුළ ඇතුළත් කර ඇත. සාමාන්‍ය තොරතුරු යටතේ කොමිෂන් සභාවේ දැක්ම, මෙහෙවර , අරමුණු, කොමිෂන් සභා සාමාජිකයන් පිළිබඳ තොරතුරු ඇතුළත්ය. ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පිළිබඳ විස්තරයක් දෙවන කොටසෙහි ඇතුළත් වෙයි. කොමිෂන් සභාව පූර්ණ වශයෙන් ම භාණ්ඩාගාර ප්‍රතිපාදන මත යැපෙන ආයතනයකි. එබැවින් 2023 වර්ෂයේ ලද ප්‍රතිපාදන හා වියදම් දැරීමට අදාළ මූල්‍ය ප්‍රකාශන තෙවන කොටසේ ඇතුළත් ය. හතර වන කොටසේ ඇතුළත් වන්නේ විගණන මතය සහිත විගණකාධිපතිවරයාගෙන් අවසන් වාර්තාව යි.

සභාපතිතුමාගේ සමාලෝචනය

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2023 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව සඳහා මාගේ සමාලෝචනය ඉදිරිපත් කරනුයේ මහත් සතුටිනි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් මූලික නීතියක් බවට පත් වූ සිංහල දෙමළ රාජ්‍ය භාෂාවන්ට අනුව රටේ සෑම පුරවැසියෙකුට ම තමන් කැමති රාජ්‍ය භාෂාවෙන් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි තමාට අවශ්‍ය සෑම සේවාවක්ම ලබා ගැනීමේ හැකියාව උදා වී ඇත.

1956 අංක 36 දරන පනත මඟින් සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට නීතිගත කිරීමෙන් පසු 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 03 වන පරිච්ඡේදයේ මූලික අයිතිවාසිකම යටතේ එහි 12(1) වගන්තිය ප්‍රකාර ව "භාෂාව මත වෙනස්කමකට හෝ විශේෂත්වයකට භාජනය නොකළ යුතුයි" යන්න මූලික නීතිය වශයෙන් බල ගැන්වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් රටේ පුරවැසියා වෙත පැවරී ඇති භාෂාවේ මූලික අයිතිය උල්ලංඝනය කිරීම, පිටු දැකීම, නොකර හැරීම පිළිබඳව වගබලා ගැනීම 1991 අංක 18 දරන පනත මගින් රාජ්‍ය භාෂා කොමිෂන් සභාව වෙත පැවරී ඇත. රාජ්‍ය භාෂා කොමිෂන් සභාව වෙත පැවරී ඇති එකී බලය යටතේ කොමිෂන් සභාව දිවයින පුරා ක්‍රියාත්මක වේ.

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව මහ භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන මත මහජන මුදලින් නඩත්තු වන රාජ්‍ය ආයතනයකි. 2023 වසරේ රාජ්‍ය භාෂා කොමිෂන් සභාව වෙත මහ භාණ්ඩාගාරයෙන් නිදහස් කෙරුණු රු. මිලියන 36.814කින් ප්‍රාග්ධන වියදම් වශයෙන් රු. මිලියන 02ක් හා පුනරාවර්තන වියදම් වශයෙන් රු. මිලියන 34.814ක්ද වැය කර ඇත. කොමිෂන් සභාවේ අනුමත 42ක් වූ කාර්ය මණ්ඩලයෙන් දැනට සිටින 21කින් යුත් කාර්ය මණ්ඩලය විසින් ආයතනයේ ප්‍රධාන කාර්ය වන අධීක්ෂණ කටයුතු, විමර්ශන කටයුතු, අධ්‍යාපන කටයුතු හා උපදේශන කටයුතු 2023 වර්ෂයේ පැවති තත්ත්ව අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම යටතේ ප්‍රමාණවත් අයුරින් ඉටු කර ඇත.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් පිහිටුවා ඇති අනෙකුත් ආයතන අතුරින් භාෂා අයිති උල්ලංඝනය කිරීම සම්බන්ධ නීතිමය බලගැන්වීමේ සුවිශේෂ කාර්යභාරයක් රාජ්‍ය භාෂා කොමිෂන් සභාව වෙත පැවරී ඇත. කොමිෂන් සභාව වෙත පැවරී ඇති අධීක්ෂණ හා නියාමන කාර්යය යටතේ 2023 වර්ෂයේ දී භාෂා විගණන 60ක් සිදු කර ඇත. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ නිර්ණායක යටතේ රාජ්‍ය ආයතන කටයුතු කර ඇත් ද යන්න සම්බන්ධයෙන් අධීක්ෂණය කර, ඒ ආයතනවල පවතින රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනනුකූල තත්ත්ව නිවැරදි කිරීමට අවශ්‍ය නිර්දේශ ලබා දීම සිදු කර ඇත. තව ද රාජ්‍ය භාෂා කොමිෂන් සභාව විසින් සකස් කර ඇති මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ආයතනයේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට ද උපදෙස් දී ඇත.

එමෙන් ම දැනට ගැසට් කර ඇති ද්විභාෂා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය නිසි අයුරින් ක්‍රියාත්මක වන්නේ ද යන්න හා ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ද්විභාෂා කොට්ඨාස ලෙස නම් කර තිබීම සුදුසු ද යන්න සම්බන්ධයෙන් නිරීක්ෂණය කිරීම සඳහා ද්විභාෂා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අයත් රාජ්‍ය ආයතන ඉහත කී අයුරින් මෙම වර්ෂයේ භාෂා විගණනයට ලක් කර ඇත.

2023 වර්ෂයේ භාෂා අයිති උල්ලංඝනය වීම් සම්බන්ධ වන පැමිණිලි 168ක් ලැබුණු අතර එයින් පෙර වර්ෂයේ පැමිණිලින් සමඟ 93ක් සඳහා විසඳුම් ලබා දී ඇත. අනෙකුත් පැමිණිලි විසඳීම සඳහා අදාළ ආයතන වෙත නිර්දේශ ලබා දී ඇත. මහජනතාව සම්බන්ධ රාජ්‍ය ආයතනවල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය හා භාෂා අයිතිය උල්ලංඝනය සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැඩි අවධානය යොමු කරයි. එවැනි අවස්ථා වශයෙන් විදුලි බල මණ්ඩලය මඟින් රතු නිවේදන නිකුත් කිරීමේ දී ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් නිකුත් කිරීම, බැංකු ණය ලබා ගැනීමේ දී ණය ගිවිසුම්

ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් නිකුත් කිරීම ආදිය සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි කොමිසම විසින් විමර්ශනය කර මේ වන විට එකී ලේඛන භාෂාත්‍රයයෙන් ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත.

සෘජු වශයෙන් භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝනය වීමට අමතර ව නාම පුවරු, උපදෙස් පුවරු, ගමනාන්ත පුවරු, ආකෘති පත්‍ර, දැන්වීම් හා වෙබ් අඩවිවල පවතින භාෂා දෝෂ සම්බන්ධයෙන් ද පැමිණිලි බහුල ව දක්නට ලැබෙන අතර කොමිෂන් සභාව මේ පිළිබඳ අවශ්‍ය නිර්දේශ නිකුත් කර ඇත. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය හා මූලික භාෂා අයිතිවාසිකම් පිළිබඳ ව මහජනතාවට ප්‍රමාණවත් දැනුමක් නොමැති හෙයින් රාජ්‍ය භාෂා කොමිෂන් සභාව මඟින් 2023 වසරේ මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය මෙන්ම සමාජ මාධ්‍ය ද භාවිතයෙන් ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් සිදු කර ඇති අතර මාර්ගගත ක්‍රමය යටතේ (Zoom) සියලු ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල නිලධාරීන් දැනුවත් කර ඇත.

රාජ්‍ය නිලධාරීන් දෙවන භාෂා ප්‍රවීණතාව ලබා ගත්ත ද ඒ ප්‍රවීණතාව මහජන සේවය ලබා දීමට තරම් ප්‍රමාණවත් නොවන බැවින් නිලධාරීන් බඳවා ගැනීමේ දී සෑම රාජ්‍ය ආයතනයක ටම ද්වි භාෂා දැනුම ඇති නිලධාරීන් දෙදෙනෙකු අවම වශයෙන් බඳවා ගැනීමට කෙටි කාලීන ව යෝජනා කර ඇති අතර, දීර්ඝකාලීනව තිරසර සංවර්ධනය සඳහා පහළ අධ්‍යාපන මට්ටමේ සිට ඉහළ අධ්‍යාපන මට්ටම දක්වා පාසල් සිසුන්ගේ සිංහල,දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා ප්‍රවීණත්වය ප්‍රවර්ධනය සඳහා රාජ්‍ය භාෂා කොමිෂන් සභාව විසින් අධ්‍යාපන දෙපාර්තමේන්තු ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙල යටතේ ජාතික අධ්‍යාපන ආයතනය සමඟ දීර්ඝකාලීන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරවීමට සාකච්ඡා කරමින් සිටී.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය රාජ්‍ය හා අර්ධ රාජ්‍ය විෂයෙහි ලා ක්‍රියාත්මක වුව ද පුද්ගලික ආයතන මඟින්ද ක්‍රියාත්මක කළ යුතු වන්නේ සමස්ත පුරවැසි ජනතාව තම අවශ්‍යතා සඳහා පුද්ගලික ආයතන සමඟ ක්‍රියා කරන බැවිනි. මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාවට නෛතික ප්‍රතිපාදන නොමැති වුව ද මහජන යහපත උදෙසා උචිත අවස්ථාවන්හි දී පුද්ගලික ආයතන සම්බන්ධයෙන් නියාමන ආයතන මඟින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක ක්‍රියාකරවීමට පියවර ගෙන ඇත.

ශ්‍රී ලංකා රජය හා කැනේඩියානු රජය අතර ගිවිසුම්ගත ව සිදු කරන ලද ජාතික භාෂා සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතියේ (NLEAP) දායකත්වයෙන් කාර්ය මණ්ඩල කුසලතා සංවර්ධනය භාෂා විගණන කටයුතු සඳහා දායකත්වය ලබා ගන්නා ලදි. විශේෂයෙන් ම ආයතනයේ මෙහෙයුම යටතේ කැනඩාවේ රාජ්‍ය භාෂා කොමිෂන් සභාව හමු වී එකී කොමිෂන් සභාවේ අත්දැකීම් ලබාගැනීමට අවස්ථාවක් 2023 වසරේ ලබා දෙන ලදී.

ඒ අනුව 2023 වසරේ රාජ්‍ය භාෂා කොමිෂන් සභාවට කාලීන ව පැවැති නොයෙකුත් දුෂ්කරතා හා පැවති කාර්ය මණ්ඩල හිඟකම මධ්‍යයේ වුව ද සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කර ගැනීමට හැකි වූ බව ඉතා සතුටින් සඳහන් කරමින්, ඒ සඳහා නොඅඩු සහාය ලබාදුන් අතිගරු ජනාධිපතිතුමාටත්, රාජ්‍ය පරිපාලන විෂයභාර ගරු අමාත්‍යවරයාට හා අගමැතිතුමාටත්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාට හා එහි කාර්ය මණ්ඩලයටත්, රාජ්‍ය භාෂා කොමිෂන් සභා සාමාජිකයන්ට හා කොමිෂන් සභාවේ සියලුම නිලධාරි මහත්ම මහත්මීන්ටත් මාගේ කෘතඥතාව මෙයින් පුද කර සිටිමි.

නීතිඥ ඩී. කලංසූරිය
සභාපති

I කොටස

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව 1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතෙහි විධිවිධානවලට අනුකූලව ස්ථාපනය කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි.

දැක්ම

මහජනයා වෙත සේවය සපයනු ලබන සියලු ආයතනවල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට බල ගැන්වූ ආයතනය බවට පත්වීම.

මෙහෙවර

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විමර්ශනය, අධීක්ෂණය, අධ්‍යාපනය සහ උපදේශනය මගින් මහජනතාවගේ ද්වීභාෂාමය අවශ්‍යතා සැපයීම.

කොමිෂන් සභාවේ පොදු අරමුණු

(අ) රාජ්‍ය භාෂා භාවිතය පිළිබඳ ප්‍රතිපත්තිමය මූලධර්ම නිර්දේශ කිරීම සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ අන්තර්ගත විධිවිධාන අනුව ක්‍රියාකිරීම පිළිබඳ ව විමසිලිමත් වීම හා අධීක්ෂණය කිරීම.

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වන ව්‍යවස්ථාවෙහි සඳහන් භාෂා භාවිතය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ භාවාර්ථයට හා චේතනාවට අනුකූල ව සිදු වන බවට වග බලා ගැනීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ක්‍රියාවන් කිරීම සහ පියවර ගැනීම.

(ඇ) රාජ්‍ය භාෂා ඇගයීම, දිරි ගැන්වීම සහ ඒවායේ තරාතිරම, සමානත්වය සහ භාවිත කිරීමේ අයිතිවාසිකම පිළිගැනීම, පවත්වාගෙන යාම සහ ඉදිරියට ගෙන යාම.

(ඈ) සිය මෙහෙයවීමෙන් සහ ලැබෙන යම් පැමිණිලිවලට ප්‍රතිචාර වශයෙන් යන දෙයාකාරයෙන් ම විමර්ශන පැවැත්වීම හා මේ පනතේ විධිවිධානවලින් සලසා ඇති පරිදි ප්‍රතිකර්ම යෙදීම.

ඉහත දැක්වෙන පොදු අරමුණුවලට අනුව කොමිෂන් සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ ඇතුළත් භාෂාව හා සම්බන්ධ ප්‍රතිපාදන නියාමනය සහ අධීක්ෂණය සිදු කරන අතර මහජනතාවගේ භාෂා අයිතීන් ආරක්ෂා කිරීමට කටයුතු කරයි.

ප්‍රධාන කාර්යයන්

කොමිෂන් සභාවේ පොදු අරමුණු ඉටු කර ගැනීම සඳහා පහත දැක්වෙන ප්‍රධාන කාර්ය සතර යටතේ හඳුනගත් වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

අධීක්ෂණය	විමර්ශනය	අධ්‍යාපනය	උපදේශනය
රාජ්‍ය භාෂා භාවිතය පිළිබඳ ව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන රාජ්‍ය යාන්ත්‍රණය විසින් නිසි පරිදි අනුගමනය කරන්නේද යන්න	ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත භාෂා අයිතීන් උල්ලංඝනය කිරීම පිළිබඳ පැමිණිලි	අදාළ භාෂාවල තරාතිරම හෝ භාවිතය හෝ පිළිබඳ ව දැනුවත් කිරීම.	ප්‍රතිපත්තිමය මූලධර්ම සම්පාදනය

සංවිධාන ව්‍යූහය


රාජ්‍ය භාෂා කොමිෂන් සභාව පත් කරනු ලබන්නේ ජනාධිපතිවරයා විසිනි. කොමිෂන් සභාව සාමාජිකයන් හය දෙනෙකුගෙන් සමන්විත වේ. එක් සාමාජිකයෙක් කොමිෂන් සභාවේ සභාපති වශයෙන් නම් කෙරේ. සභාපතිවරයා කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා ද වේ. කොමිෂන් සභා පනතට අනුව කොමිෂන් සභාවේ ධුර කාලය වසර 03කි.

2020/01/22 දින පත් කරන ලද කොමිෂන් සභාව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය. ආචාර්ය කවිතා රාජරත්නම් මහත්මිය 2022/06/05 දින කොමිෂන් සභාවෙන් ඉල්ලා අස් වූ අතර 2023/07/31 දින නැවත වරක් කොමිෂන් සභා සාමාජික වශයෙන් පත් කරනු ලැබුවාය. පහත නම් සඳහන් අනෙකුත් මහත්ම මහත්මීන් මේ වර්ෂයේ දී සභාපති හා සාමාජික ධුරවල කටයුතු කර ඇත.

1. නීතිඥ ඩී. කලංසූරිය (සභාපති)
2. මහාචාර්ය සඳගෝමි කෝපරහේවා (කොළඹ විශ්ව විද්‍යාලය)
3. මහාචාර්ය රදිරාණි යෝගේන්ද්‍රරාජා (යාපනය විශ්ව විද්‍යාලය)
4. මහාචාර්ය දුෂ්‍යන්ති මෙන්ඩිස් (කොළඹ විශ්ව විද්‍යාලය)
5. ආචාර්ය කවිතා රාජරත්නම් (කැලණිය විශ්ව විද්‍යාලය)
6. වසන්ත ඒකනායක (හිටපු ලේකම් - සංස්කෘතික, කලා සහ බුද්ධශාසන අමාත්‍යාංශය)

2023/01/01 දින සිට 2023/11/31 දින දක්වා රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ නිලලත් ලේකම් වශයෙන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 වන පන්තියේ නිලධාරිණියක වන රාජ්‍ය භාෂා කොමසාරිස් සැනෝජී රුවිනිකා පෙරේරා මහත්මිය කටයුතු කළාය. තව ද 2023/12/06 දින සිට 2023/12/31 දින දක්වා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 වන පන්තියේ නිලධාරියෙකු වන ශමින්ද මහලේකම් මහතා නිල බලයෙන් පත් වුණු කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් කටයුතු කර ඇත.

2023/12/31 දිනට රාජ්‍ය භාෂා කොමිෂන් සභාවෙහි සංවිධාන ව්‍යුහය



කාර්ය මණ්ඩලය

කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 42කි. එහෙත් තථ්‍ය සේවක සංඛ්‍යාව 2023/12/31 දිනට 18කි. මෙය අනුමත කාර්ය මණ්ඩලයෙන් 50% කටත් වඩා අඩු ප්‍රමාණයකි. රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් සීමා කර තිබූ බැවින් මේ වර්ෂය තුළ දී කොමිෂන් සභාව අවම කාර්ය මණ්ඩලයක් මඟින් සියලු ක්‍රියාකරකම් දියත් කර ඇත. (වගු අංක 01 බලන්න)

වගු අංක 01

අනු අංකය	නිල නාමය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	සටහන
01.	අධ්‍යක්ෂ	01	-	පුරප්පාඩු 01
02.	සහකාර අධ්‍යක්ෂ	01	01	
03.	භාෂා නිලධාරී	03	01	පුරප්පාඩු 02
04.	පරිපාලන නිලධාරී	01	01	
05.	මූල්‍ය නිලධාරී	01	-	පුරප්පාඩු 01
05.	ප්‍රධාන ලිපිකරු	01	01	
06.	භාෂා ප්‍රවර්ධන හා විමර්ශන නිලධාරී	10	03	පුරප්පාඩු 07
07.	සංවර්ධන නිලධාරී	04		පුරප්පාඩු 04
08.	කළමනාකරණ සහකාර	10	07	පුරප්පාඩු 03
09.	භාෂා පරිවර්තක (දෙමළ/ ඉංග්‍රීසි)	01	-	පුරප්පාඩු 01
10.	භාෂා පරිවර්තක (සිංහල/ ඉංග්‍රීසි)	01	-	පුරප්පාඩු 01
11.	භාෂා පරිවර්තක (සිංහල/ දෙමළ)	01	-	පුරප්පාඩු 01
12.	රියදුරු	03	02	පුරප්පාඩු 01
13.	කාර්යාල කාර්ය සහායක	04	02	පුරප්පාඩු 02
	මුළු සංඛ්‍යාව	**42**	**18**	**පුරප්පාඩු 24**

විගණන කමිටුව

පොදු ව්‍යාපාර පිළිබඳ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති මාර්ගෝපදේශ අනුව රාජ්‍ය භාෂා කොමිෂන් සභාව සඳහා විගණන කමිටුවක් පත් කරන ලදි. කොමිෂන් සභාව වෙත අමාත්‍යාංශයෙහි අභ්‍යන්තර විගණන අංශය හා රජයේ විගණනය මඟින් ඉදිරිපත් කරන විගණන විමසුම් මේ කමිටුවේ දී සාකච්ඡාවට භාජනය කෙරේ.

විගණන කමිටුවෙහි සභාපති වශයෙන් කොමිෂන් සභා සාමාජිකයෙකු කටයුතු කරන අතර කමිටුවෙහි සාමාජිකයන් වශයෙන් කොමිෂන් සභා සාමාජිකයෝ දෙදෙනෙක්, රජයේ විගණන අංශයේ නියෝජිතයෙක් හා අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක කටයුතු කරති.

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ උපාය මාර්ගික සැලැස්ම

පොදු ව්‍යාපාර පිළිබඳ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති මාර්ගෝපදේශ සංග්‍රහය මගින් පාලනය වන සියලු ම ආයතන උපාය මාර්ගික සැලැස්මක් නිර්මාණය කළ යුතුය. රාජ්‍ය භාෂා කොමිෂන් සභාව භාවිත කළ සංයුක්ත සැලැස්ම වෙනුවට ඉහත සඳහන් මාර්ගෝපදේශ ප්‍රකාර ව නව උපායමාර්ගික සැලැස්මක් 2023 වර්ෂයේ දී පිළියෙල කරන ලදි.

මේ උපාය මාර්ගික සැලැස්ම පිළියෙල කිරීම ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨ විශ්‍රාමික නිලධාරියෙකු වන උපදේශක අශෝක ගුණවර්ධන මහතා වෙත පවරන ලදි. පිළියෙල කරන ලද උපාය මාර්ගික සැලැස්මෙහි කොමිෂන් සභාව සඳහා නව ආයතනික ව්‍යූහයක් ඉදිරිපත් කර ඇති අතර එය ඉදිරි වසර 04ට අදාළ වන පරිදි පිළියෙල කරන ලදි.

කොමිෂන් සභා රැස්වීම්

2023 වර්ෂයේ කොමිෂන් සභා රැස්වීම් 13ක් පහත සඳහන් දිනවල දී පවත්වා ඇත.

වගු අංක 02

රැස්වීම් දිනය
2023.01.19
2023.02.15
2023.03.16
2023.04.19
2023.05.17
2023.06.27
2023.07.31
2023.08.29
2023.09.26
2023.10.23
2023.11.08
2023.11.30
2023.12.19

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව පහත දැක්වෙන තීරවලට එළඹී ඇති අතර පහත සඳහන් නිරීක්ෂණ ද මේ වර්ෂය තුළ සිදු කොට ඇත.

- රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවතින නෛතික ප්‍රතිපාදන ප්‍රමාණවත් බව
- රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය හා භාෂා අයිතිවාසිකම් සම්බන්ධයෙන් කාර්යක්ෂමව මහජනතාව දැනුවත් කිරීම සඳහා සමාජ මාධ්‍ය භාවිතා කිරීම.
- ද්වි භාෂා කොච්ඨාස පිළිබඳ ව අධ්‍යයනය කර වාර්තා පිළියෙල කොට ගරු අග්‍රාමාත්‍යතුමා වෙත ඉදිරිපත් කිරීම.
- රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සහ ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය මඟින් පවත්වනු ලබන භාෂා පුහුණු වැඩසටහන් සමාලෝචනය කිරීම.
- කොමිෂන් සභාවේ නියෝග අනුව ක්‍රියාත්මක නොවන ආයතන වෙත ඒ පිළිබඳ ව අවධානය යොමු කරවමින් ලිපි යැවීම.
- දුම්රිය ස්ථානවල නිවේදන සිදු කිරීම වෙනුවට ත්‍රිභාෂා ඩිජිටල් පුවරු ප්‍රදර්ශනය.
- කොමිෂන් සභාව සිදු කරන භාෂා විගණන හා විමර්ශනවලින් රැස් කර ගනු ලබන තොරතුරු ඇතුළත් කර රජය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
- සෑම රාජ්‍ය ආයතනයකටම භාෂා සංස්කාරවරයෙකු පත් කිරීම.

II කොටස

2023 වර්ෂයේ කොමිෂන් සභාව ඉටු කළ ප්‍රධාන ක්‍රියාකාරකම්

කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්ය වන අධීක්ෂණය, විමර්ශනය, අධ්‍යාපනය/ දැනුවත් කිරීම සහ උපදේශනයට අදාළ ව පහත සඳහන් ක්‍රියාකරකම් සිදු කරයි.

අධීක්ෂණය - භාෂා විගණන/ දුම්රිය ස්ථානවල නිවේදන පරීක්ෂාව/විශේෂ සමීක්ෂණ පැවැත්වීම.

විමර්ශනය - මහජන පැමිණිලි හා සිය මෙහෙයවීමෙන් සොයා ගන්නා භාෂා අයිතිවාසිකම් උල්ලංඝනය වීම් පිළිබඳ ක්‍රියා මාර්ග ගැනීම.

අධ්‍යාපනය - මහජනතාව, රාජ්‍ය නිලධාරීන්, අර්ධ රාජ්‍ය ආයතනවල නිලධාරීන් හා පාසල් සිසුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

උපදේශනය - ප්‍රතිපත්තිමය මූලධර්ම සම්පාදනය පිළිබඳ ව රජයට නිර්දේශ ලබා දීම.

1. අධීක්ෂණය

රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවල රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සඳහා භාෂා විගණන පවත්වන ලදී. භාෂා විගණන සිදු කිරීමට ආයතන තෝරා ගැනීමේ දී පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කෙරිණි.

- මහජනතාවට සමීප සේවා සැපයීම.
- ආයතනය පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජන සංයුතිය
- පෙර වර්ෂවල භාෂා විගණන සිදු කර තිබීම.
- මහජන පැමිණිලි ඉදිරිපත් වී ඇති ආයතන
- කොමිෂන් සභාව මඟින් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇති ආයතන
- විශේෂ සේවාවන් සපයන ආයතන
- ද්වි භාෂා පරිපාලන කොට්ඨාස තුළ පිහිටීම.

ඉහත දැක්වෙන නිර්ණායකවලට අනුව කාර්යාලයක් පවත්වා ගෙන යාමෙන් එම කාර්යාලය ද්වි භාෂා සේවය ලබා දිය හැකි ආයතනයක් බවට පරිවර්තනය කල හැකිය. එබැවින් භාෂා විගණනයක දී මේ නිර්ණායකයන්ට අනුකූල ව ආයතන පරීක්ෂාව සිදු කරයි.

මෙම වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පොලිස් ස්ථාන, බැංකු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, මහ නගර සභා, ප්‍රාදේශීය සභා හා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ඇතුළත් ආයතන 60ක නියැදියක් විගණනයට ලක් කෙරිණි.

1.1 ප්‍රාදේශීය ලේකම් කාර්යාල

ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිදු කරන ලද භාෂා විගණන වගු අංක 03හි ඇතුළත් ය. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 34ක් විගණනයට ලක් කරන ලද අතර, ඒ සියල්ල ද්වි භාෂා කාර්යාල වේ. වැඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංඛ්‍යාවක් විගණනයට තෝරා ගැනීමට එක් හේතුවක් වන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් මහජන සේවා රැසක් සැපයීම යි.

වගු අංක 03

ප්‍රාදේශීය ලේකම් කාර්යාල		
1.කොළඹ	13.පන්විල	25.හාලිඇල
2.තිඹිරිගස්යාය	14.පස්බාගකෝරළේ	26.හපුතලේ
3.දෙහිවල - ගල්කිස්ස	15.උඩපළාත	27.වැලිමඩ
4.බේරුවල	16.ගඟ ඉහළ කෝරළේ	28.හල්දුමුල්ල
5.ගාල්ල කඩවත්සතර	17.මහනුවර කඩවත්සතර	29.ලුණුගල
6.වවුනියාව දකුණ	18.මාවනැල්ල,	30.පස්සර
7.පුත්තලම	19.රත්නපුර	31.ලංකාපුර
8.කල්පිටිය	20.බදුල්ල	32.වැලිකන්ද
9. මුන්දලම	21.සොරණාතොට	33.කැකිරාව
10.වනාතවිල්ලුව	22.මීගහකිවුල	34.දෙහිඅත්තකණ්ඩිය
11. අකුරණ	23.ඇල්ල	
12. දෙල්තොට	24.බණ්ඩාරවෙල	



ඡායාරූපය 01 - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොළඹ



ඡායාරූපය 02 - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඇල්ල

පොදුවේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පහත දැක්වෙන රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූල නොවන කරුණු අනාවරණය විය.


I. ආකෘති පත්‍ර භාෂාත්‍රයයෙන් නොමැති වීම.
II. සිංහල/දෙමළ භාෂා පරිවර්තකයන් නොමැති වීම.
III. උප්පැන්න, විවාහ, මරණ සහතික තනි භාෂාවෙන් ලබා දීම.
IV. භාෂා ද්විත්වයෙන් රාජකාරි ඉටු කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරුන්ගේ හිඟකම
V. ද්වි භාෂා ප්‍රවීණතාව ඇති නිලධාරීන්ගේ හිඟය.

1.2 පොලිස් ස්ථාන

විගණනයට ලක් කරන ලද පොලිස් ස්ථාන වගු අංක 04 හි ඇතුළත් වේ. පොලිස් ස්ථාන 08ක් විගණනයට ලක් කර ඇති අතර, මේ පොලිස් ස්ථාන සියල්ල ද්වි භාෂා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පිහිටා ඇත.

වගු අංක 04

පොලිස් ස්ථාන	
1.	ත්‍රිකුණාමලය පොලිස් ස්ථානය
2.	බම්බලපිටිය පොලිස් ස්ථානය
3.	කොස්ගස් හංදිය පොලිස් ස්ථානය
4.	කොටහේන පොලිස් ස්ථානය
5.	නුවරඑළිය පොලිස් ස්ථානය
6.	වවුනියාව පොලිස් ස්ථානය
7.	පුත්තලම පොලිස් ස්ථානය
8.	දෙහිඅත්තකණ්ඩිය පොලිස් ස්ථානය





ඡායාරූපය 03 සහ 04- පොලිස් ස්ථානය , පුත්තලම

පොලිස් ස්ථාන විගණනවලදී පොදුවේ හඳුනාගන්නා ලද අනනුකූලතා හා ගැටළු පහත පරිදි වේ.

I. දෙමළ භාෂා ප්‍රවීණතාව සහිත පොලිස් නිලධාරීන්ගේ හිඟය

II. බොහොමයක් පොලිස් ස්ථානවල දෙමළ හා මුස්ලිම් ජනතාවගේ පැමිණිලි සටහන් කිරීම සහ විමර්ශනය සිංහල භාෂාවෙන් සිදු කිරීම.

III. ළමා හා කාන්තා කාර්යාංශය වෙත ලැබෙන රහස්‍යභාවය ආරක්ෂා වන පරිදි සටහන් කළ යුතු හා විමර්ශනය කළ යුතු ඇතැම් පැමිණිලි සඳහා නෙවන පාර්ශ්වයකගේ (භාෂා පරිවර්තන) සහාය ලබා ගැනීම.

1.3 අනෙකුත් ආයතන

මේ වර්ෂයේ විගණනයට ලක් කරන ලද අනෙකුත් ආයතන වගු අංක 05හි දැක් වේ. රාජ්‍ය බැංකු, මහා නගර සභා, ප්‍රාදේශීය සභා, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මේ විගණනවලට ඇතුළත් වේ.

වගු අංක 05

ආයතනය	
1.	ගාල්ල මහා නගර සභාව
2.	ගාල්ල ප්‍රධාන ලේකම් කාර්යාලය
3.	ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
4.	ජාතික ඉතිරිකිරීමේ බැංකුව, රාජගිරිය
5.	මහජන බැංකුව, රාජගිරිය
6.	ලංකා බැංකුව, රාජගිරිය
7.	ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව
8.	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
9.	කොටුව දුම්රිය ස්ථානය



ඡායාරූපය 05 - මහා නගර සභාව, නුවරඑළිය



ඡායාරූපය 06 - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය



ඡායාරූපය 07 - ප්‍රාදේශීය සභාව, ත්‍රිකුණාමලය



ඡායාරූපය 08 - ජාතික ඉතිරිකිරීමේ බැංකුව, රාජගිරිය

භාෂා විගණනවල දී පහත දැක්වෙන කරුණු පොදුවේ නිරීක්ෂණය විය.

I. පිළිගැනීමේ කවුළුවෙහි රාජකාරි සිදු කරන නිලධාරීන්ට භාෂා ද්විත්වයෙන් තොරතුරු ලබා දීමේ හැකියාවක් නොමැති වීම.
II. මහජන ප්‍රදර්ශිත පුවරුවල අක්ෂර වින්‍යාස දෝෂ පැවතීම.
III. දෙවන භාෂා ප්‍රවීණතාව ඇති නිලධාරීන්ගේ හිඟය
IV. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන නිලධාරි හා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි තම වගකීම් නිසි ආකාරයෙන් හඳුනා නොගැනීම. (COLIO සහ OLIO)
V. නිලධාරීන් දෙවන භාෂා ප්‍රවීණතාව ලබා ගත්ත ද එම ප්‍රවීණතාව දෙවන රාජ්‍ය භාෂාවෙන් සේවය ලබා දීමට ප්‍රමාණවත් නොවීම.
VI. සිංහල - දෙමළ භාෂා පරිවර්තකයන්ගේ හිඟය
VII. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන නොමැති වීම.
VIII. නෛතික ලේඛන පරිවර්තනය කිරීම සඳහා ප්‍රවීණතාව ඇති පරිවර්තකයින්ගේ හිඟය (උදා: බැංකුවල ගිවිසුම් පරිවර්තනය)
IX. ස්ථාන මාරුවීම් හේතුවෙන් ද්වි භාෂා දැනුම සහිත නිලධාරීන්ගේ සේවය අත්‍යවශ්‍ය කාර්යාල සඳහා ලබා ගැනීමේ දුෂ්කරතාව.

මාර්ගගත ක්‍රමය යටතේ භාෂා විගණනයට ලක්කරන ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාල

මේ යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 215ක් භාෂා විගණනයට ලක් කර ඇත. භෞතික ව සිදු කරන භාෂා විගණනයේ දී ලබා ගන්නා තොරතුරු මාර්ගගත ක්‍රමය හරහා ද ලබා ගැනිණි. මෙමගින් ආයතන වැඩි සංඛ්‍යාවක් ආවරණය කිරීමට හැකි විය. මාර්ගගත භාෂා විගණනය ප්‍රධාන පියවර 06කින් සමන්විතය.

1. සම්බන්ධීකරණ කටයුතු සඳහා එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් නිලධාරියෙකු නම් කර ගැනීම.
2. සම්බන්ධීකරණ නිලධාරීන් සඳහා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය හා රාජ්‍ය භාෂා කොමිෂන් සභාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් Zoom මඟින් පැවැත්වීම.
3. විගණනය සඳහා තාක්ෂණික උපදෙස් ඇතුළත් මාර්ගෝපදේශ වීඩියෝවක් නිලධාරීන් වෙත යැවීම.
4. මාර්ගගත විගණනය සිදු කරනු ලබන Google පත්‍රිකාව එක නිලධාරීන්ට යැවීම හා පසුවිපරම් කර සති දෙකක් තුළ පිළිතුරු ලබා ගැනීම.
5. Google පත්‍රිකාව මඟින් ලබා ගන්නා දත්ත විශ්ලේෂණය කර විගණන වාර්තා සැකසීම.
6. අදාළ නිර්දේශ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත යොමු කර හා මසකින් ප්‍රගතිය පරීක්ෂා කිරීම.

2. පැමිණිලි විමර්ශනය.

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝනය වීම සම්බන්ධයෙන් ලැබෙන මහජන පැමිණිලි විමර්ශනය සඳහා කොමිෂන් සභා පනත මඟින් කොමිෂන් සභාව වෙත විශේෂිත බලතල හිමි වී ඇත. එවැනි පැමිණිලි විමර්ශනය කිරීම කොමිෂන් සභාවේ එක් ප්‍රධාන කාර්යයකි. කොමිෂන් සභාව විමර්ශනය ක්‍රම දෙකකින් සිදු කරයි.

I. භාෂා අයිතිවාසිකම් උල්ලංඝනය වීම් සම්බන්ධ ලැබෙන මහජන පැමිණිලි විමර්ශනය
II. සිය මෙහෙයවීමෙන් සොයා ගනු ලබන රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝනය කිරීම් විමර්ශනය

කොමිෂන් සභාව වෙත මහජන පැමිණිලි පහත ආකාරවලින් යොමු වේ.

i. ලිපි මඟින්
ii. කොමිෂන් සභාව වෙත පැමිණීමෙන්
iii. මුද්‍රිත මාධ්‍යවලින්
iv. විද්‍යුත් තැපෑලෙන්
v. දුරකථන මාර්ගයෙන්
vi. අමාත්‍යාංශයේ 1956 ඇමතුම් මධ්‍යස්ථානය වෙත යොමු වන පැමිණිලි
vii. රාජ්‍ය භාෂා කොමිෂන් සභා වෙබ් අඩවිය
viii. කොමිෂන් සභාවේ සමාජ මාධ්‍යජාල (Facebook, Whtas App,) වලට ලැබෙන පණිවිඩ මගින්

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව වෙත 2023 වර්ෂයේ භාෂා අයිතීන් උල්ලංඝන වීම සම්බන්ධ මහජන පැමිණිලි 170ක් ලැබී ඇත. මේ වර්ෂයේ විමර්ශනය අවසන් කළ පැමිණිලි සංඛ්‍යාව 93කි. (වගු අංක 06 බලන්න) පෙර වර්ෂවලදී ලැබුණු පැමිණිලි ද මීට ඇතුළත් වේ.

වගු අංක 06

2023 වර්ෂය තුළ විසඳන ලද පැමිණිලි සංඛ්‍යාව=93	
2023	**55**
2022	**20**
2021	**00**
2020	**07**
2019	**11**
මුළු පැමිණිලි සංඛ්‍යාව	**93**

2023 වර්ෂයේ ඉතිරි පැමිණිලි 113 සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කරමින් පවතින අතර, එකී පැමිණිලි සඳහා මේ වන විට නිර්දේශ නිකුත් කර ඇත. ඒ නිර්දේශ ලබා දී ඇත්තේ රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතේ පැමිණිලි විමර්ශනය කිරීම සම්බන්ධ ව දක්වා ඇති කාලසීමාවට අනුකූලව යි.

2023 වර්ෂයේ කොමිෂන් සභාව වෙත ලැබුණු විශේෂිත පැමිණිලි කිහිපයක් වගු අංක 07හි දැක්වේ.

වගු අංක 07

අංකය	පැමිණිල්ල	විමර්ශනය මගින් ලබාගත් ප්‍රගතිය
01	වැල්ලවත්ත ප්‍රදේශයේ බොහෝ විවාහ රෙජිස්ට්‍රාර්වරුන් විවාහ සහතිකය නිකුත් කරන්නේ සිංහල භාෂාවෙන් පමණක් නිසා දෙමළ ජනතාව අපහසුතාවට පත් වීම.	නිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් වැල්ලවත්ත ප්‍රදේශයේ දෙමළ භාෂා මාධ්‍යයෙන් විවාහ සිදු කිරීමට දෙමළ මාධ්‍ය රෙජිස්ට්‍රාර්වරයෙකු පත් කිරීම.
02	බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් බස්නාහිර පළාත් පාසැල් සඳහා උපාධිධාරීන් බඳවා ගැනීමට පළ කරන ලද දැන්වීම සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් පමණක් සකස් කර ඇති අතර දෙමළ භාෂාවෙන් සකස් කර නොමැති වීම.	රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ සභාපති විසින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිසන් සභාවේ ලේකම් වෙත මේ සම්බන්ධයෙන් දුරකථන මාර්ගයෙන් දැනුම්දීමක් සිදු කරන ලදී. ඉන්පසුව. එදින ම අදාළ දැන්වීම දෙමළ භාෂාව ද ඇතුළත් කර නැවත පළ කරන ලදී.

03	බේරුවල රෝහලේ වෛද්‍යවරුන්, ම නිලධාරීන් හෙදහෙදියන් ඇතුළු සියලු මහ ජනතාවට සේවය ලබා දීමේ දී සිංහල භාෂාවෙන් පමණක් සේවය ලබා දීම හේතුවෙන් දෙමළ භාෂාවෙන් සේවය ලබා ගැනීමට පැමිණෙන ජනතාව දැඩි අපහසුතාවට පත්වීම.	බේරුවල රෝහල මගින් මහජනතාව සම්බන්ධ වන ස්ථානවලට දෙමළ භාෂාවෙන් සේවය කළ හැකි වෛද්‍යවරුන්, හෙද හෙදියන් සහ අනිකුත් නිලධාරීන් අනුයුක්ත කර අවශ්‍ය සේවා ලබා දීමට පියවර ගැනීම.
04	මොණරාගල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් දෙමළ භාෂාවෙන් සේවය ලබා ගැනීමට පැමිණෙන මහජනතාව සඳහා ඔවුන්ගේ භාෂාවෙන් ලිපි ඉදිරිපත් කිරීමේ දී එකී ලිපි භාර නොගෙන එහි සිංහල භාෂා පරිවර්තනයක් ලබා දෙන ලෙසට දැනුම් දීම හේතුවෙන් දෙමළ භාෂාවෙන් සේවය ලබා ගැනීමට පැමිණෙන මහජනතාව දැඩි අපහසුතාවට පත් වීම.	මොනරාගල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් දැනුම් දී ඇත්තේ මෙවැනි සිදුවීමක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කිසිදු අංශයකින් සිදු වී නොමැති බවයි. තව ද රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කැප වීමෙන් කටයුතු කරන බව ද දැනුම් දී ඇත.
05	ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය මඟින් මහජනතාව වෙත නිකුත් කරන කෙටි පණිවිඩ ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් යැවීම නිසා පාරිභෝගිකයින් අපහසුතාවට පත් වී ඇති බවත්, එකී කෙටි පණිවිඩ සිංහල සහ දෙමළ භාෂාවෙන් ද යවන ලෙස ඉල්ලීම.	අදාළ කෙටි පණිවිඩ සිංහල හා දෙමළ භාෂාවෙන් යැවීමට පියවර ගෙන ඇත.
06	මැතිවරණ කොමිෂන් සභාව විසින් පක්ෂ රැස්වීම් සඳහා යවනු ලබන Whatsapp කෙටි පණිවිඩ නැඟෙනහිර පළාතේ පක්ෂ සාමාජිකයන් වෙත සිංහල භාෂාවෙන් පමණක් යැවීම නිසා එම පක්ෂ රැස්වීම් සඳහා පක්ෂ සාමාජිකයන්ට සහභාගි වීමට නොහැකි වූ බැවින්, ඒ කෙටි පණිවිඩ නැඟෙනහිර පළාතේ පක්ෂ සාමාජිකයන් වෙත දෙමළ භාෂාවෙන් යොමු කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලීම.	මැතිවරණ කොමිෂන් සභාව මගින් උතුරු නැඟෙනහිර පක්ෂ සාමාජිකයන් සඳහා තොරතුරු දැනුම් දීමේ දී සිංහල හා දෙමළ භාෂාවලින් එක ම අවස්ථාවේ පණිවිඩ යොමු කිරීමට කටයුතු කරන බව දැනුම් දී ඇත.
07	රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව මගින් උප්පැන්න, මරණ සහ විවාහ සහතිකවල තොරතුරු ලිවීමේ දී තම මව් භාෂාව මූලික කර ගෙන දෙවන භාෂාවෙන් හා සන්ධාන භාෂාවෙන් ද නිකුත් කළ යුතු බව	උප්පැන්න සහතිකය සිංහල / ඉංග්‍රීසි හා දෙමළ/ඉංග්‍රීසි භාෂාවලින් නිකුත් කිරීමට 2021 වර්ෂයේ සිට ම කටයුතු කර ඇති බවත් මරණ සහ විවාහ සහතික ද සිංහල/ඉංග්‍රීසි හා දෙමළ/ඉංග්‍රීසි භාෂාවලින් නිකුත් කිරීමට කටයුතු කරන බවත් දන්වා ඇත.

3. අධ්‍යාපනය /දැනුවත් කිරීම

මේ යටතේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. දැනුවත් කිරීම සඳහා මූලික වශයෙන් පහත දැක්වෙන කණ්ඩායම් තෝරා ගැනේ.

I. ආයතන ප්‍රධානීන් (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින්)
II. මහජනතාව වෙත විශේෂිත සේවා සපයන ලබන රාජ්‍ය දෙපාර්තමේන්තුවල නිලධාරීන්
III. භාෂා විගණන සිදු කරන ලද ආයතනවල නිලධාරීන් (පොලිස් ස්ථාන, ප්‍රාදේශීය ලේකම් කාර්යාල)
IV. අර්ධ රාජ්‍ය ආයතනවල නිලධාරීන්
V. මහජනතාව
VI. පාසල් සිසුන්

දැනුවත් කිරීමේ වැඩසටහන්වල දී රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල නිලධාරීන් දැනුවත් කරනු ලබන්නේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධව නිලධාරීන්ගේ නෛතික බැඳීම පිළිබඳව යි. නිලධාරීන් අයත් වන්නේ සේවා සැපයුම් අංශයේ පාර්ශවකරුවන් ලෙසය. සේවාලාභීන් ලෙස මහජනතාව දැනුවත් කිරීමේ කටයුතු කරයි. මෙහි දී විශේෂ අවධානය යොමු කරනු ලබන්නේ භාෂා අයිතිවාසිකම් සම්බන්ධයෙනි.

රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ දී වැඩමුළු, සම්මන්ත්‍රණ හා කෙටි වීඩියෝ වැඩසටහන් භාවිතයට ගන්නා ලදි. එමෙන්ම දැනුවත් කිරීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ ද නිලධාරීන් දැනුවත් කරන ලදි.

පුරවැසියන්ගේ භාෂා අයිතිවාසිකම් සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා ප්‍රධාන වශයෙන් ජනමාධ්‍ය භාවිතා කෙරේ. කොමිෂන් සභාව සිදු කරන ලද නිරීක්ෂණවලින් අනාවරණය වූ කරුණක් වන්නේ භාෂා අයිතිවාසිකම් පිළිබඳව මහජනතාව තුළ පවතින දැනුවත්භාවය තව දුරටත් වර්ධනය කළ යුතු බව යි.

මෙම වර්ෂය තුළදී මහජනතාව දැනුවත් කිරීම සඳහා කොමිෂන් සභාව ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය හා මුද්‍රිත මාධ්‍ය උපයෝගි කර ගනිමින් වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කර ඇත.

3.1 ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය

වගුව අංක 08හි කොමිෂන් සභාව ප්‍රචාරය කළ ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය වැඩසටහන් ඇතුළත්ය.

වගු අංක 08

අනු අං	වැඩසටහන	දිනය
01	ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ “සුභාරතී”වැඩසටහන	2024.02.20
02	ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ “ අලුත් දිනයක්”වැඩසටහන ඔස්සේ පවත්වන ලද සාකච්ඡාව	2024.02.02
03	නේත්‍රා නාලිකාවේ (වණක්කම් නේත්‍රා) ආයුබෝවන් නේත්‍රා..... වැඩසටහන යටතේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම	2023.07.05
04	ජාතික රූපවාහිනී නාලිකාවේ “සංහිඳ” වැඩසටහන යටතේ රාජ්‍ය භාෂා කොමිෂන් සභාව, එහි කාර්යය භාරය සහ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් දැනුවත් කිරීම.	2023.07.07
05	රාජ්‍ය භාෂා සතිය වෙනුවෙන් චරණ නාලිකාවේ “උදා ඉරේ සහෘදයා” වැඩ සටහන යටතේ ජනතාව දැනුවත් කිරීම	



ඡායාරූපය 09 - "සුභාරතී"වැඩ සටහන



වණක්කම් නේත්‍රා | Vanakkam Nethra | 2023-07-05 | Nethra Channel

ඡායාරූපය 10 – නේත්‍රා නාලිකාවේ වණක්කම් නේත්‍රා (ආයුබෝවන් නේත්‍රා) වැඩසටහන



ඡායාරූපය 11 - අලුත් දිනයක් වැඩසටහන



Sanhida | 2023-07-07 | Rupavahini

ඡායාරූපය 12 - "සංහිඳ" වැඩසටහන




D. Kalansooriya AAL | Uda Ire Sahurdaya

ඡායාරූපය 13 -"උදා ඉරේ සහෘදයා" වැඩසටහන

ඉහත වැඩසටහන් අතරින් "සුභාරතී" වැඩසටහන සඳහා ග්‍රාමීය මට්ටමේ ජනතාවගෙන් පවා ප්‍රශ්න ඉදිරිපත් විය. මෙය වැඩසටහන් සම්බන්ධයෙන් හඳුනා ගත් හොඳ ප්‍රවණතාවයකි. ඉදිරියේ දී මෙම ප්‍රවණතා වැඩි දියුණු වන ආකාරයෙන් කටයුතු කළ යුතුය.

3.2 මාර්ගගත ක්‍රමය ඔස්සේ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම.

උතුරු-මැද පළාත, ඌව, වයඹ, සබරගමුව, මධ්‍යම, නැගෙනහිර සහ උතුරු පළාත්වල Zoom තාක්ෂණය ඔස්සේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රධාන රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරීහු (COLIO) හා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ නිලධාරීහු (OLIO) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ ව දැනුවත් කරනු ලැබුහ.



3.3 මුද්‍රිත මාධ්‍ය

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව භාෂා අයිතිවාසිකම් සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා පළ කරන ලද පුවත් පත් දැන්වීම් වගු අංක 09හි ඇතුළත්ය.

වගු අංක 09

අනු අං	වැඩසටහන	දිනය
01	" රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය අයිතියකි." යන මැයෙන් දිනමිණ පුවත් පතෙහි පළ වූ දැන්වීම	2023.07.06
02	" භාෂා අයිතිය කඩ වුව හොත් කොමිසමට කියන්න මැයෙන් " දිනමිණ පුවත් පතෙහි පළ වූ ලිපිය	2023.08.15
03	" ඉංග්‍රීසියට පෙර මවු බස ඉගෙන ගන්න." මැයෙන් දිනමිණ පුවත් පතෙහි පළ වූ ලිපිය	2023.11.23







3.4 භාෂා ප්‍රවර්ධන කව පිහිටුවීම

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට ඇති එක් ප්‍රධාන ගැටලුවක් වන්නේ ද්වි භාෂා හැකියාව සහිත නිලධාරීන්ගේ හිඟයයි. මෙයට හේතු වන්නේ වර්තමාන රාජ්‍ය සේවයේ සිටින බොහෝ නිලධාරීන් පාසැල් අධ්‍යාපනය මඟින් මවු භාෂාව හා සන්ධාන භාෂාව පමණක් හදාරා තිබීම යි.

වර්තමාන පාසල් අධ්‍යාපනය මගින් මවු භාෂාවට අමතර ව දෙවන භාෂාව හා ඉංග්‍රීසි භාෂාව ඉගෙනගැනීමට අවකාශ සැලසී ඇත. දෙවන භාෂාව ඉගෙනීම සඳහා 09 වන ශ්‍රේණිය දක්වා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අවකාශ සැලසේ. මේ වැඩ පිළිවෙළ මඟින් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා තුන ම පිළිබඳ ව දැනුමක් ලබා ගැනීමට සැම ශිෂ්‍ය ශිෂ්‍යාවකට ම හැකි වේ. භාෂා තුන ඉගෙනීම අධ්‍යාපනයට සමගාමී ක්‍රියාකාරකම් මඟින් තව දුරටත් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් කොමිෂන් සභාව අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කොට පාසල්වල පාසල් භාෂා කව ප්‍රවර්ධනය කිරීමේ වැඩපිළිවෙළක් 2015 වර්ෂයේ දී ආරම්භ කරන ලදි. මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් 01/2015 චක්‍රලේඛය නිකුත් කෙරිණි.

අනාගත පරපුර සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙහි තිරසාර දැනුමක් සහිත පුරවැසියන් බවට පත් කිරීම පාසල් භාෂා කව මඟින් අපේක්ෂිතයි.

මේ චක්‍රලේඛයේ ඇතුළත් අරමුණු පහත පරිදි වේ.

I. ද්වි භාෂා ශක්‍යතාවෙන් හෘදයාංගම ව බැඳුණු එක ම ලාංකේය ජාතියක් බිහි කිරීමේ අරමුණු සිසු පරපුර වෙත ළඟා කිරීම.
II. පාසල් ළමුන් තුළ ත්‍රෛභාෂා භාවිතය සම්බන්ධයෙන් ආකල්ප හා උනන්දුව ඇති කිරීම.
III. පාසලේ දී ඇසෙන, දකින, කියන සෑම දෙයක් ම භාෂාත්‍රයෙන් ලබා දීම.
IV. මවු භාෂාව, දෙවන ජාතික භාෂාව හා සන්ධාන භාෂාව යන භාෂා තුන ම ප්‍රායෝගික ලෙස භාවිතයට ගැනීම උනන්දු කරවීම.
V. පන්ති කාමරයේ න්‍යායික ව ඉගෙනුම ලබන භාෂා ප්‍රායෝගික ලෙස භාවිතා කිරීමේ කුසලතාව ලබාදීම.
VI. සියලු ම බාහිර කටයුතුවල දී ප්‍රායෝගික වශයෙන් භාෂාත්‍රය භාවිතෙයන් වැඩසටහන් මෙහෙයවීම. (උදා: ක්‍රීඩා කටයුතුවල දී, රැස්වීම්වල දී)

මේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අදාළ වන ක්‍රියාකාරකම් චක්‍රලේඛයේ ඇතුළත් ය. පාසල්වල භාෂා කව පිහිටුවා මේ ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලසුමක් පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතුය. මේ වර්ෂයේ දී පහත දැක්වෙන භාෂා කව දෙක ස්ථාපනය කරන ලදි.

- 2023.07.26 දින විපුලානන්ද දෙමළ විද්‍යාලය
- 2023.07.28 දින සීවලී මධ්‍ය මහා විද්‍යාලය



ඡායාරූපය 14 - විපුලානන්ද දෙමළ විද්‍යාලය




ඡායාරූපය 15 - සීවලී මධ්‍ය මහා විද්‍යාලය

මෙයට අමතර ව දැනට පිහිටුවා ඇති පාසල් භාෂා කව 03ක ක්‍රියාකාරිත්වය පසුවිපරමට ලක් කෙරිණි. එම පාසල් පහත පරිදි වේ.

- හමිසා විද්‍යාලය, කොළඹ.
- කුමාර උදයම් දෙමළ විද්‍යාලය, කොළඹ.
- කනපති හින්දු කාන්තා විද්‍යාලය, කොළඹ.



ඡායාරූපය 16- හමිසා විද්‍යාලය



ඡායාරූපය 17- කුමාර උදයම් දෙමළ විද්‍යාලය



ඡායාරූපය 18 - කනපති හින්දු කාන්තා විද්‍යාලය,

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව විසින් සිදුකරන ලද අනෙකුත් කාර්යයන්

01. රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ නිල Facebook ගිණුමක්, Youtube නාලිකාවක් ආරම්භ කිරීම හා පවත්වා ගෙන යාම.

02. පාසැල් සිසුන්ගේ ද්විභාෂා හැකියාව වර්ධනය කිරීම සම්බන්ධයෙන් පාසැල් පද්ධතිය තුළ ගත යුතු පහත සඳහන් ක්‍රියා මාර්ග සම්බන්ධ ව අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන ආයතනය සමග සාකච්ඡා කිරීම.

    - ✓ අ.පෙ.ස. සා/පෙළ විභාගයේ දී දෙවන භාෂාව අනිවාර්ය විෂයයක් බවට පත් කිරීම.
    - ✓ පුරවැසි අධ්‍යාපන විෂය යටතේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධ පාඩමක් ඇතුළත් කිරීම.

03. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික භාෂා, සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතිය සමඟ ඒකාබද්ධ ව වැඩසටහන් පැවැත්වීම

04. Centre for Governance Innovations (CGI) ආයතනය සමඟ ඒකාබද්ධ ව භාෂා විගණන සඳහා ප්‍රශ්නාවලියක් සැකසීම.

ජාතික භාෂා සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතිය

කැනේඩියානු රජය මඟින් ලබා දෙන ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වූ ජාතික භාෂා සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතිය මගින් පහත දැක්වෙන ක්‍රියාකාරකම් සඳහා අනුග්‍රහය ලබා දී ඇත.

තාක්ෂණික දැනුම හුවමාරු කිරීමේ වැඩසටහන

කොමිෂන් සභාවේ සභාපති හා පරිපාලන නිලධාරි ජාතික භාෂා සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතිය මඟින් සංවිධානය කරන ලද කැනඩාවේ පැවති තාක්ෂණික දැනුම හුවමාරු කර ගැනීමේ වැඩසටහනට සහභාගි වූහ. මෙහි දී විශේෂ අවධානයට යොමු කරන ලද්දේ කැනඩාවේ භාෂා කොමසාරිස් කාර්යාලය මඟින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගනු ලබන ක්‍රමවේද මෙහි දී පහත සඳහන් විශේෂ කරුණු නිරීක්ෂණය විය.

I. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වාර්ෂිව සොයා ගනු ලබන කරුණු වාර්ෂික වාර්තාව මගින් ප්‍රසිද්ධ කිරීම.
II. සෑම පාර්ශ්වකරුවෙක් වෙත ම වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර අදහස ලබා ගැනීම.
III. භාෂා විගණන මඟින් සොයාගනු ලබන කරුණු ප්‍රසිද්ධ කිරීම.
IV. භාෂා ප්‍රතිපත්තිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් පළමු ව දැනුවත් කිරීම මඟින් විසඳුම් සෙවීමට කටයුතු කිරීම.



ඡායාරූපය 19- කැනේඩියානු භාෂා කොමසාරිස් කාර්යාලය

පැමිණිලි විමර්ශනය සඳහා මාර්ගෝපදේශ සංග්‍රහය

1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනත මඟින් භාෂා අයිතීන් උල්ලංඝණයවීම සම්බන්ධ මහජන පැමිණිලි විමර්ශනය කිරීම සඳහා විශේෂ බලතල මෙම කොමිෂන් සභාව වෙත හිමි වී තිබේ.

පැමිණිලි විමර්ශනය කිරීමේ පරිපාටිය කොමිෂන් සභා පනතේ ඇතුළත් වේ. ඒ පරිපාටිය අනුගමනය කරමින් පැමිණිලි විමර්ශනය සිදු කළ අතර ඒ විමර්ශන කාර්ය වඩාත් විධිමත් හා කාර්යක්ෂම කිරීම සඳහා පැමිණිලි විමර්ශනයට අදාළ අත් පොතක් නිර්මාණය කිරීමට පියවර ගන්නා ලදි. මෙමඟින් පහත සඳහන් ප්‍රතිලාභ හිමි වේ.

I. පනතෙහි සඳහන් පැමිණිලි විමර්ශන පරිපාටිය සරල ව පැහැදිලි කිරීම.
II. පුහුණු අත් පොතක් ලෙස භාවිත කිරීම.
III. නීති ක්ෂේත්‍රයේ අත්දැකීම් නොමැති ආධුනික නිලධාරීන්ට පහසුවෙන් භාවිත කළ හැකි වීම.
IV. විමර්ශනයට අදාළ ආකෘති සියල්ල අන්තර්ගත වීම.

භාෂා විගණන සඳහා ප්‍රතිපාදන සැපයීම.

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව භාණ්ඩාගාරය මඟින් ලැබෙන ප්‍රතිපාදන මත පමණක් ක්‍රියාත්මක ආයතනයකි. මේ වර්ෂයේ දී වවුනියාව, නුවරඑළිය හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල සිදු කරන ලද භාෂා විගණන සඳහා ජාතික භාෂා සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතිය මගින් ප්‍රතිපාදන සපයන ලදී. ඒ අනුව වැඩි භාෂා විගණන සංඛ්‍යාවක් අවසන් කිරීමට අවකාශ සැලසිණි.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පුහුණුව සහ කේන්ද්‍රීය නිලධාරීන් පත් කිරීම.

කොමිෂන් සභාවේ නිලධාරීන් වෙනුවෙන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පුහුණු වැඩසටහන් පවත්වන ලදි. එමෙන් ම කොමිෂන් සභාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා කේන්ද්‍රීය නිලධාරීන් දෙදෙනෙක් පත් කරන ලදහ.

2023 වර්ෂයේ ක්‍රියාකාරකම් දියත් කිරීමේ දී පැවති අභියෝග

මානව සම්පත් හිඟය

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 42කි. මේ වර්ෂයේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 18 ක් පැවති අතර කොමිෂන් සභාවේ සියලු කාර්යයන් ඉටු කරන ලද්දේ නිලධාරීන් 24කින් සමන්විත කාර්ය මණ්ඩලයක් මඟිනි. රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් අත්හිටුවා ඇති බැවින් ඉහත සඳහන් කාර්ය මණ්ඩල පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට නොහැකි විය.

කාර්ය මණ්ඩල හිඟය හේතුවෙන් පහත දැක්වෙන අභියෝගවලට මුහුණ පෑමට කොමිෂන් සභාවට සිදු විය.

- මානව සම්පත් හිඟය
- භාෂා පරිවර්තන කටයුතු නිසි පරිදි සිදු කර ගැනීමට නොහැකි වීම.
- පැවති කාර්ය මණ්ඩලයේ නිපුණතා වර්ධනය කිරීම.
- කාර්ය මණ්ඩලයේ නෛතික අපේක්ෂා ඉටු කර ගැනීමට නොහැකි වීම නිසා සේවකයන් ආයතනයෙන් ඉවත් වීම.
- අඩු වැටුප් පරිමාණ පැවතීම.

IIIකොටස



රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

මූල්‍ය ප්‍රකාශන

2023

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

2023 දෙසැම්බර් මස 31 දිනට මූල්‍යතත්ත්ව ප්‍රකාශනය

වත්කම්	සටහන	2023	2022
භාණ්ඩ ලේඛන	1	403,435.00	292,855.00
පෙර ගෙවීම්	2	39,905.15	72,527.44
සේවකයින්ට ලබාදෙන ණය	3	3,256,839.85	3,902,170.04
ඉන්වෙන්ට්‍රි අයිතම		-	-
ලිපි ද්‍රව්‍ය (තොග)		1,345,867.77	1,294,648.70
උප අග්‍රිම පියවීම		-	3.00
මුදල් සහ මුදල් සමාන		3,053,903.04	1,275,267.12
විශේෂ අත්තිකාරම්		-	-
අයවිය යුතු ආපදා ණය පොලී	15	-	2,203.60
උත්සව අත්තිකාරම්		10,000.00	8,754.00
අනිකුත් වත්කම්		-	-
		8,109,950.81	**6,848,428.90**
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත සහ උපකරණ	4	8,211,059.79	12,923,363.47
අස්පෘශ්‍ය වත්කම්	4.1	491,840.00	553,320.00
ආපසු අයකර ගැනීමේ අත්පත් කරගන්නා ලද වත්කම්	4.2	954,680.16	-
		9,657,579.95	**13,476,683.47**
මුළු වත්කම්		**17,767,530.76**	**20,325,112.37**
සම කොටස් සහ බැරකම්			
ජංගම බැරකම්			
ගෙවිය යුතු	5	3,702,861.43	4,233,849.73
විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන		132,614.00	172,414.00
		3,835,475.43	**4,406,263.73**
ජංගම නොවන බැරකම්			
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	6	**5,338,977.50**	**4,395,671.17**
මුළු බැරකම්		**9,174,452.93**	**8,801,934.90**
සමුච්චිත අතිරික්තය/හිඟය	7	**17,767,530.76**	**20,325,112.37**

මෙයට අමුණා ඇති සටහන මෙම මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩ කොටසක් සාදයි. වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් දක්වා ඇත්තේ අඩුකිරීම් ය.

මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිති සහ රජයේ මූල්‍ය රෙගුලාසි වක්‍රලේඛවලට අනුකූලව පිළියෙල කොට ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම වෙනුවෙන් කොමිෂන් සභාව වගකියනු ලැබේ. කොමිෂන් සභාව සඳහා සහ ඒ වෙනුවෙන් අත්සන් කරන ලදී.

.....	.....	.....
(සභාපති)	(කොමිෂන් සභා සාමාජික)	ආර්.යූ. හෙට්ටිතන්ත්‍රිගේ (ගණකාධිකාරි - වැඩබලන)

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව
2023 දෙසැම්බර් 31 වෙනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

	සටහන	2023	2022
ආදායම්			
භාණ්ඩාගාරයෙන්ලැබුනු පුනරාවර්තන ප්‍රදානයන්		34,814,000.00	28,309,000.00
ආදායම		134,388.70	33,302.85
වෙනත් ආදායම්	8	138,716.46	164,861.25
මුළු ආදායම්		**35,087,105.16**	**28,507,164.10**
වියදම්			
වැටුප්, වේතනසහ සේවක ප්‍රතිලාභ	9	16,655,304.12	16,800,105.14
සැපයුම් සහ පරිභෝජ්‍ය පාවිච්චි කිරීම්	10	2,050,235.46	1,912,834.88
ක්ෂය කිරීම්		3,994,537.46	3,555,232.63
අළුත්වැඩියා සහ නඩත්තු කිරීම්	11	4,902,190.85	3,262,062.97
උපයෝග සහ අනිකුත් සේවාවන්	12	9,564,918.31	9,721,632.71
අනිකුත් වියදම්	13	565,582.57	546,315.94
රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන්	14	2,322,732.50	2,007,341.51
විගණන ගාස්තු		250,000.00	250,000.00
මුළු වියදම්		**40,305,501.27**	**38,055,525.78**
කාලපරිඡේදය සඳහා අතිරික්තය/(හිඟය)		**(5,218,396.11)**	**(9,548,361.68)**

මූල්‍ය ප්‍රකාශනවලට අමුණා ඇති සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩ කොටසක් සාදයි. වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් දක්වා ඇත්තේ අඩුකිරීම් ය.

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව
2023 දෙසැම්බර් 31 වෙනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/හිමිකම්වල වෙනස්වීමේ ප්‍රකාශනය

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව
2023 දෙසැම්බර් 31 වෙනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/හිමිකම්වල වෙනස්වීමේ ප්‍රකාශනය

	භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රතිපාදන	සමුච්චිත අරමුදල	වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය)	වෙනත්	ප්‍රතිසංගණන සංචිතය	එකතුව
2023.01.01 දිනට ආරම්භක ශේෂය	-	10,567,639.16	-	-	-	10,567,639.16
උත්සව අත්තිකාරම් ශේෂයේ ආරම්භක ශේෂයට කරන ලද ගැළපීම්		2,000.00				2,000.00
අස්පෘශ්‍ය වත්කම්වල (වෙනී අඩවිය) ආරම්භක ශේෂයට කරන ලද ගැළපීම්		614,800.00				
භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රග්ධන ප්‍රදානයන්	2,300,000.00	-	-	-	-	2,300,000.00
ප්‍රතිසංගණනය කිරීම්	-	-	-	-	7,586,500.00	7,586,500.00
2022 වර්ෂය සඳහා අතිරික්තය / හිඟය	-	-	(9,548,361.68)	-	-	(9,548,361.68)
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,300,000.00**	**11,185,039.16**	**(9,548,361.68)**	**-**	**7,586,500.00**	**11,523,177.48**
2023 ජනවාරි 01 දිනට ශේෂය		11,523,177.48				11,523,177.48
ආරම්භක ශේෂයේ එකතු වරද නිවැරදි කිරීම්				(0.01)		(0.01)
ඡේවකයින් සඳහා ලබාදෙන ලද ණයෙහි පෙර වර්ෂයේ ශේෂය නිවැරදි කිරීම				(17.99)		(17.99)
2023 වර්ෂයේදී ලැබුණු මාර්ගෝපදේශ පොත් තොගයේ විවිනාකම් ගැලපීම්				287,500.00	-	287,500.00
උප අලුම් පියවීම් නිවැරදි කිරීම්				14.46		14.46
2023 වර්ෂයේදී කොමිෂන් සභාවට මාරු කරනු ලැබූ අධ්‍යක්ෂවරියට ගෙවන ලද විශේෂ අත්තිකාරම් මුදලින් ආපසු අයකර ගනු ලැබූ මුදලට ගැලපීම්				800.00		800.00
භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රග්ධන ප්‍රදානයන්	2,000,000.00					2,000,000.00
2023 වර්ෂය සඳහා අතිරික්තය / හිඟය			(5,218,396.11)			(5,218,396.11)
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,000,000.00**	**11,523,177.48**	**(5,218,396.11)**	**288,296.46**	**288,296.46**	**8,593,077.83**

මූල්‍ය ප්‍රකාශනවලට අමුණා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් සාදයි. වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් දක්වා ඇත්තේ අඩුකිරීම් ය.

රාජ්‍යභාෂා කොමිෂන් සභාව
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ගැලීම් ප්‍රකාශය

	2023 රු.	2022 රු.
මෙහෙයුම්ක්‍රියාකාරකම්වලින් මුදල් ගැලීම		
අතිරික්තය/(හිඟය)	(5,218,396.11)	(9,548,361.68)
ජංගම නොවන සංචලනය		
පාරිතෝෂික	1,131,901.33	443,058.40
ක්ෂය කිරීම්	3,994,537.46	3,555,232.63
පෙර වර්ෂයේ ගැලපීම්		
උත්සව අත්තිකාරම් ශේෂය ගැලපීම	-	2,600.00
ආපදා ණය ආරම්භක ශේෂය ගැලපීම	(17.99)	
2022 වර්ෂයේදී ලැබුණු මාර්ගෝපදේශ පොත් තොගයේ වටිනාකමට ගැලපීම	287,500.00	
වර්ෂය තුළදී කරන ලද පාරිතෝෂික ගෙවීම්	(188,595.00)	
උප අග්‍රිම පියවීම් නිවැරදි කිරීම	14.46	
2023 වර්ෂයේදී කොමිෂන් සභාවට මාරු කරනු ලැබූ අධ්‍යක්ෂවරියට ගෙවන ලද විශේෂ අත්තිකාරම් මුදලින් ආපසු අයකර ගනු ලැබූ මුදලට ගැලපීම්	800.00	-
ජංගම නොවන සංචලනවලින් පසුව මුදල් ගැලීම	7,744.15	(5,547,470.65)
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්		
පෙර ගෙවීම්වල (වැඩිවීම්)/අඩුවීම්	32,622.29	(49,829.44)
භාණ්ඩ ලේඛනවල (වැඩිවීම්)/අඩුවීම්	(110,580.00)	45.00
සේවකයින්ට ලබාදෙන ලද ණයවල (වැඩිවීම්)/අඩුවීම්	645,330.19	116,656.90
ඉන්වෙන්ට්‍රි අයිතම්වල (වැඩිවීම්)/අඩුවීම්	-	103,500.00
ලිපිද්‍රව්‍යවල (තොග) (වැඩිවීම්)/අඩුවීම්	(51,219.07)	(820,628.96)
අනිකුත් වත්කම්වල (වැඩිවීම්)/අඩුවීම්	-	14,950.00
උපඅග්‍රිමවල (වැඩිවීම්)/අඩුවීම්	3.00	(3.00)
විශේෂ අත්තිකාරම්වල (වැඩිවීම්)/අඩුවීම්		2,000.00
නොපියවන ලද අත්තිකාරම්වල (වැඩිවීම්)/අඩුවීම්	-	-
අයවිය යුතු ආපදා ණය පොලිවල (වැඩිවීම්)/අඩුවීම්	2,203.60	(2,203.60)
උත්සව අත්තිකාරම්වල (වැඩිවීම්)/අඩුවීම්	(1,246.00)	(1,354.00)
ගෙවිය යුතු - (වැඩිවීම්)/අඩුවීම්	(530,988.30)	88,207.41
උපඅග්‍රිම පියවීම්වල වැඩිවීම්/(අඩුවීම්)	-	-
ගෙවිය යුතු විගණන ගාස්තුවල (වැඩිවීම්)/අඩුවීම්	(39,800.00)	36,400.00
	(53,674.29)	(512,259.9)
මෙහෙයුම්ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගැලීම	**(45,930.14)**	**(6,059,730.34)**
ආයෝජනක්‍රි යාකාරකම්වලින් මුදල් ගැලීම		
දේපළ යන්ත්‍ර සහ පිරියත මිළදී ගැනීම්	(175,433.94)	(842,974.34)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගැලීම	**(175,433.94)**	**(842,974.34)**
මූල්‍යක්‍රියාකාරකම්වලින් මුදල් ගැලීම		
භාණ්ඩාගාරයෙන් ලැබුනු ප්‍රාග්ධනප්‍රදානයන්	2,000,000.00	2,300,000.00
මූල්‍යක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ගැලීම	**2,000,000.00**	**2,300,000.00**
මුදල් සහ සමාන අගයන්හි ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්)	**1,778,635.92**	**(4,602,704.68)**
වර්ෂය ආරම්භයේදී මුදල් සහ සමාන අගයන්	1,275,267.12	8,877,971.80
වර්ෂය අවසානයේදී මුදල් සහ සමාන අගයන්	3,053,903.04	1,275,267.12

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව
2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම් ප්‍රතිපත්ති

1. වාර්තා කරන ආයතනය

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව 1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනත මගින් සංස්ථාපනය කරන ලද පූර්ණ ලෙස රජයට අයත් ව්‍යවස්ථාපිත මණ්ඩල ආයතනයක් වන අතර, එය රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ විෂයපථයට අයත් වේ. කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්යාලය "ජනජය සිටි" ගොඩනැගිල්ල, 09 වෙනි මහල, නාවල පාර, රාජගිරිය යන ස්ථානයේ පිහිටා ඇත.

1.1 ප්‍රතිපත්තිමය ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය

කොමිෂන් සභාවේ ප්‍රතිපත්තිමය ක්‍රියාකාරකම වන්නේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමයි.

1.2 සේවක සංඛ්‍යාව

2023 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ සේවක සංඛ්‍යාව 20 ක්වූ අතර, 2023 වර්ෂය සඳහා අනුමත සේවක සංඛ්‍යාව 42 කි.

1.3 මූල්‍ය ප්‍රකාශනවල වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම වෙනුවන් අධ්‍යක්ෂක මණ්ඩලය වගකියනු ලැබේ.

2 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලවීමේ ප්‍රකාශනය

මෙම මූල්‍ය ප්‍රකාශන මූල්‍ය කාර්යසාධනයේ ප්‍රකාශනය, මුදල් ගැලීමේ ප්‍රකාශනය, සමකොටස්වල (Equity)වෙනස්වීමේ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් යන කරුණුවලින් සමන්විත වේ. මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනය, මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශය සහ විගණකාධිපති දෙපාර්මේන්තුව එක්ව නියම කොට ඇති පරිදි සහ මුදල් රෙගුලාසි සහ අදාළ රජයේ වක්‍රලේඛවල දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූලව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව පිළියෙල කොට ඇත.

2.2 ඇගයීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන; 1983 අංක 12 දරන පාරිතෝෂික පනත පාදක කරගත් සේවක විශ්‍රාම පාරිතෝෂික හැර ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කොට ඇත. මූල්‍ය ප්‍රකාශනවල උද්ධමනීය සාධක සඳහා ගැලපීම් සිදුකොට නැත.

2.3 ඉදිරිපත් කරනු ලබන මුදල් වර්ගය

මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කරනු ලබන්නේ ශ්‍රී ලංකා රුපියල් වලිනි.

ඇස්තමේන්තුවල සුවිශේෂී ක්ෂේත්‍ර සම්බන්ධ තොරතුරු සහ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනෙන ගණන් මත අවිනිශ්චිත ලෙස වඩාත් සුවිශේෂී බලපෑම් වන්නේ පහත කරුණු ය.

සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන (සටහන 6)
වත්කම් අපහායනය කිරීම (සටහන 4 සහ 4.1)

2.4 ද්‍රව්‍යාත්මක බව සහ ඒකරාශි කිරීම

එක් එක් වර්ගවලට අයත් සමරූපී අයිතමයන් වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත. අසමරූපී වර්ගවල හෝ කාර්යයන්හි අයිතමයන් අද්‍රව්‍ය මිසක වෙන්කර ගෙනහැර දක්වා ඇත.

2.5 සංසන්දනාත්මක තොරතුරු

සංසන්දනාත්මක තොරතුරු පවත්නා වර්ෂයේ ඉදිරිපත් කිරීමට සෑම විටම අනුකූලතාවයක් දක්වන පරිදි වර්ගීකරණය ඇත.

3 සුවිශේෂී ගිණුම් පිළිවෙත්

පසුගිය වර්ෂයේ භාවිතා කරන ලද ගිණුම් පිළවෙත් වෙනස් නොවන අතර, ඒවා අස්පීත්වය විසින් ස්ථිර ලෙසම අදාළ කරගෙන ඇත.

3.1 වත්කම් සහ ඒවා තක්සේරු කිරීමේ පදනම
දේපළ, පිරියත සහ උපකරණ

හඳුනා ගැනීම සහ මිනුම් කිරීම

දේපළ, පිරියත සහ උපකරණ, ඒවා ගනු ලැබූ මිළ හෝ ඒ මත වූ යම් වෙනත් ආනුෂංගික වියදම් මත සටහන් කොට ඇත. මෙම වත්කම් පහතින් දක්වා ඇති පදනම මත සපයනු ලබන අඩු සමුච්චිත ක්ෂයවීමේ වියදමෙහි දක්වනු ලැබේ.

දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය, වත්කම් ලබාගැනීමට සෘජුවම අය කළ හැකි වියදමට ඇතුළත් කොට ඇත. මහා භාණ්ඩාගාරයෙන් හෝ වෙනත් රාජ්‍ය අයතනයකින් වත්කම් මාරු කරනු ලබන අවස්ථාවේදී එම වත්කම් ලබාගැනීමට එකී ආයතනයට වැය වූ වියදම් හෝ ප්‍රත්‍යාගණනය කරනු ලබන මුදල මත එම වත්කම් පාවිච්චි කරන්නේ නම් එවිට එය වත්කම් පිරිවැය ලෙස සටහන් කරනු ලැබේ.

සම්පූර්ණයෙන් ක්ෂයවී සහ භාවිතා කළ නොහැකි තත්ත්වයේ පවතින වත්කම් එහෙත් ඒවා කොමිෂන් සභාව විසින් භාවිතා කරමින් තිබෙන්නේ නම් ඒවායේ උපයෝගී ආයු කාලය තක්සේරු කළ නොහැකි බැවින් ඒවා ප්‍රත්‍යාගණනය කිරීම හෝ අපහායනය (impair) කිරීම සිදුකරයි. කෙසේ වෙතත් මෙවැනි ආකාරයේ වත්කම් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහනෙහි අනාවරණය කරනු ඇත.

3.2 ඇස්තමේන්තු භාවිතය සහ තීරණ

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඇස්තමේන්තු සෑදීම, තීරණ ගැනීම සහ උපකල්පනය කිරීම, ගිණුම් පිළිවෙත් අදාළ කරගැනීමේදී ඇතිවන බලපෑම, වාර්තාගත වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් ආදිය පිළිබඳව කළමණාකරනය විසින් සැලකිල්ලට ගැනීමට අවශ්‍ය වේ. ඇස්තමේන්තු සහ උපකල්පනය කිරීම්, තත්ත්ව යටතේ එකහ විය හැකි යැයි විශ්වාස කෙරෙන ඓතිහාසික අත්දැකීම් සහ වෙනත් විවිධ සාධක මත පදනම් වේ. තථ්‍ය ප්‍රතිඵල ඇස්තමේන්තුගත මුදලින් වෙනස් විය හැකි ය.

ක්ෂය කිරීම

සම්පූර්ණ වර්ෂයේ ක්ෂය කිරීම සපයනු ලබන්නේ එකී අයිතම මිළදී ගනු ලැබූ වර්ෂයේ වන අතර, 2008 වර්ෂයට පෙර මිළදී ගනු ලැබූ අයිතම සඳහා වර්ෂය තුළ කරනු ලැබූ අපහරණය කිරීම්වලට ක්ෂය කිරීම් සපයා නැත. ක්ෂය කිරීම් ගණනය කරනු ලබන්නේ 2008 වර්ෂයෙන් පසුව මිළදී ගනු ලැබූ වත්කම් සඳහා අයිතමය මිළදී ගනු ලැබූ දිනය / අයිතමය අපහරණය කරනු ලැබූ මාසය මත ය.

මේ වර්ෂයට සහ සංසන්දනාත්මක වර්ෂය සඳහා සළුල ආයු කාලය පහත පරිදි වේ.

පිරියත සහ යන්ත්‍රෝපකරණ	අවුරුදු 05 යි
කාර්යාලීය උපකරණ	අවුරුදු 10 යි
කාර්යාලීය ගෘහභාණ්ඩ	අවුරුදු 10 යි
මෝටර් රථ	අවුරුදු 04 යි
පරිගණක	අවුරුදු 04 යි
වායුසමීකරණ යන්ත්‍ර	අවුරුදු 05 යි
ගොඩනැගිලි හා ව්‍යුහයන්	අවුරුදු 10 යි
ගොඩනැගිලි - සේදුම් කාමරය	අවුරුදු 20 යි
අස්පෘශ්‍ය වත්කම් - වෙබ් අඩවිය	අවුරුදු 10 යි

3.3 භාණ්ඩ ලේඛන

භාණ්ඩ ලේඛන දක්වනු ලබන්නේ පහල පිරිවැයකින් සහ ශුද්ධ උපලබ්ධි අගයන්වලිනි. ශුද්ධ උපලබ්ධි අගය යනු පවාරණ සහ විකුණුම් වියදම්වල ඇස්තමේන්තුගත පිරිවැයෙන් ඇස්තමේන්තුගත විකුණුම් මිළ අඩුකළ පසු ලැබෙන අගයයි. භාණ්ඩ ලේඛනය, කොමිෂන් සභාවේ ප්‍රකාශනයෙන් සමන්විත වේ. මෙම ප්‍රකාශනවල උපලබ්ධි අගය යනු මිළ ස්ථාවර වනවිට විකුණුම් මිළ ය. මේ සම්බන්ධයෙන් දැරීමට විකුණුම් පිරිවැය අනුමත කරනු නොලැබේ.

3.4 පෙර ගෙවීම් සහ කළ යුතු ගෙවීම්

පෙර ගෙවීම් සහ කළ යුතු ගෙවීම්, දරණු ලබන තථ්‍ය පිරිවැයෙහි සහ කොන්ත්‍රාත්තුව යටතේ දැරිය යුතු පිරිවැයෙහි දක්වා ඇත.

3.5 සේවකයින්ට ලබාදෙන ණය

සේවකයින්ට ලබාදන ණය පිළිබඳ සඳහන් කරනු ලබන්නේ පිරිවැයෙහි ය. අනුමැතිය ලබාදී නොමැති නිසා නුසුදුසු හෝ ආපසු ලබාගත නොහැකි ණය වෙනුවෙන් ප්‍රතිපාදන සාදා නොමැත. නුසුසුදු හෝ ආපසු ලබාගත නොහැකි ණය පිළිබඳ විස්තර අනාවරණය කිරීම ලෙස මූල්‍ය ප්‍රකාශනයෙහි සඳහන් කොට ඇත.

3.6 පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ 1983 අංක 12 දරන පාරිතෝෂික පනතට අනුව ය. දැනට සිටින ස්ථීර සේවකයින් සඳහා වර්ෂයට අදාළ පාරිතෝෂික ලෙස තමාට හිමි අවසන් මාසයේ මූලික වැටුපෙන් අඩක් වන සේ ගණනය කොට ලබාදෙනු ඇත.

3.7 ආදායම්

පුනරාවර්තන වියදම් වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිදහස් කරනු ලබන අක්මුදල් අග්‍රිමය ආදායමක් ලෙස හඳුනා ගැනේ. ප්‍රාග්ධන වියදම් සඳහා අක්මුදල් අග්‍රිමය හෝ ප්‍රාග්ධන වියදම්හි සෘජු මාරුකිරීම් හෝ ප්‍රාග්ධන වත්කම්හි සෘජු මාරුකිරීම් කොමිෂන් සභාවේ සමුච්චිත සෘජු ප්‍රාග්ධනායනය ලෙස හඳුනාගැනේ.

3.8 වියදම්

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි වියදම් හඳුනාගනු ලබන්නේ දැරීමට සිදුවන පිරිවැයෙහි සෘජු සම්බන්ධය සහ ආදායමෙහි විශේෂිත වූ අයිතමයෙහි ඉපයීම් පදනම් කරගෙන ය. කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් වෙනුවන් දරනු ලබන සියළුම වියදම් එනම් දේපළ යන්ත්‍රෝපකරණ සහ උපකරණ නඩත්තු කිරීමේදී දැරීමට සිදුවන වියදම් සහ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට යන වියදම් ආදී සියළුම වියදම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුළත් කොට ඇත.

3.9 මුදල් ගැලීමේ ප්‍රකාශනය

මුදල් ගැලීමේ ප්‍රකාශනය පිළියෙල කොට ඇත්තේ සෘජු නොවන ක්‍රමය භාවිතා කරමිනි.

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. භාණ්ඩ ලේඛණ
ප්‍රකාශන

ප්‍රකාශනයෙහි නම	2023 රු.	2022 රු.
ඉංග්‍රීසි සිංහල පදමාලා	26,750.00	53,050.00
දෙමළ ඉංග්‍රීසි පදමාලා	15,345.00	24,390.00
දෙමළ විශේෂ පදමාලා	135.00	135.00
පැය 40 කෙටිකාලීන පාඨමාලා පොත	217,925.00	215,280.00
එකතුව	**403,435.00**	**292,855.00**

2. පෙර ගෙවීම්

	2023	2022
2888 - කැපැල් ගාස්තු		12,075.00
2862 - කාර්යාලීය උපකරණ නඩත්තු කිරීම	39,905.15	32,277.44
2864 - පරිගණක නඩත්තු කිරීම		28,175.00
	39,905.15	**72,527.44**

3. සේවකයින්ට ලබාදෙන ණය සහ අත්තිකාරම්

අත්තිකාරම් වර්ගය	2023.01.01 දිනට ශේෂය	එකතු කිරීම් / ආරම්භක ශේෂය ගැලපීම	ප්‍රාග්ධන අයකරගැනීම්	2023.12.31 දිනට ශේෂය
උත්සව අත්තිකාරම්	8,754.00	130,000.00	128,754.00	10,000.00
ආපදා ණය	3,902,170.04	601,976.31	1,247,306.50	3,256,839.85
විශේෂ අත්තිකාරම්	-	32,000.00	34,800.00	(2,800.00)
	3,910,924.04	**763,976.31**	**1,410,860.50**	**3,264,039.85**
				(646,884.19)

* ආපදා ණය ආරම්භක ශේෂය ලෙස රු. **17.99** ක මුදලක් එකතු කිරීමෙන් පසුව

* **2023** වර්ෂයේදී කොමිෂන් සභාවට මාරු කරන ලද අධ්‍යක්ෂකවරියගෙන් රු. **800.00** ක් විශේෂ අත්තිකාරම් මුදලක් ආපසු අයකර ගැනීමෙන් පසුව

* නිලධාරීන් 7 දෙනෙකුගේ දෙසැම්බර් වැටුපෙන් වැරදීමකින් වැඩිපුර ආපසු අයකර ගන්නා ලද රු. **2,800.00** මුදල

4. දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ
පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකම

වර්ගය	2023.01.01 දිනට ශේෂය	එකතු කිරීම් / ප්‍රත්‍යාගණනය කිරීම්	අපහරණය කිරීම් / ප්‍රත්‍යාගණනය කිරීම්	2023.12.31 දිනට ශේෂය
ගොඩනැගිලි සහ ව්‍යුහයන්	2,996,296.25	-	-	**2,996,296.25**
පරිගණක	2,500,600.00	-	-	**2,500,600.00**
මෝටර් රථ	7,500,000.00	-	-	**7,500,000.00**
පිරියත සහ යන්ත්‍රෝපකරණ	108,500.00	-	-	**108,500.00**
කාර්යාලීය ගෘහ භාණ්ඩ	6,234,004.05	27,830.00	-	**6,261,834.05**
කාර්යාලීය උපකරණ	882,655.48	132,700.00	-	**1,015,355.48**
මුළු පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකම	**20,222,055.78**	**160,530.00**	**-**	**20,382,585.78**

4.1 සමුච්චිත ක්ෂය කිරීම්

ගොඩනැගිලි සහ ව්‍යුහයන්	358,233.68	299,629.63	-	657,863.31
පරිගණක	2,115,882.92	969,362.50	-	3,085,245.42
මෝටර් රථ	1,875,000.00	1,875,000.00	-	3,750,000.00
පිරියත සහ යන්ත්‍රෝපකරණ	43,400.00	21,700.00	-	65,100.00
කාර්යාලීය ගෘහ භාණ්ඩ	3,674,112.29	623,400.41	-	4,297,512.70
කාර්යාලීය උපකරණ	221,519.44	94,285.13	-	315,804.57
මුළු සමුච්චිත ක්ෂය කිරීම්	**8,288,148.33**	**3,883,377.66**	**-**	**12,171,525.99**
ශුද්ධ පොත් අගය	**11,933,907.45**			**8,211,059.79**

අස්පෘශ්‍ය වත්කම්				
වෙබ් අඩවිය	614,800.00	-	-	614,800.00
සමුච්චිත ක්ෂය කිරීම්	614,800.00	614,800.00	-	614,800.00
වෙබ් අඩවිය	614,800.00	614,800.00	-	614,800.00
ශුද්ධ පොත් අගය	553,320.00			491,840.00
ආපසු අයකර ගැනීමේ පදනම මත අත්පත් කරගනු ලැබූ වත්කම්				
සේදුම් කාමරය	993,596.00	14,903.94	-	1,008,499.94
	993,596.00	14,903.94	-	1,008,499.94
සමුච්චිත ක්ෂය කිරීම්				
සේදුම් කාමරය	4,139.98	49,679.80	-	53,819.78
	4,139.98	49,679.80	-	53,819.78
ශුද්ධ පොත් අගය	989,456.02			954,680.16

අනාවරණය කිරීම්

1. රු. 1,376,850.00 ක් වටිනා පරිගණක සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති අතර ඒවා ප්‍රත්‍යාගණනය කළ යුතුය.

2. රාජ්‍ය භාෂා කොමිෂන් සභාව විසින් වත්කම් කේතාංකනය කිරීමේ පද්ධතියක් 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කර ඇති අතර එමගින් සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් හඳුනාගෙන ප්‍රත්‍යාගණනය කර ඇත.

3. මෙම ගොඩනැගිල්ල ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව සතු ගොඩනැගිල්ලකි. එබැවින් සේදුම් කාමරයේ ශුද්ධ අගය පදනම් කරගෙන එය ඉදිකිරීමේදී දැරීමට සිදුවූ ප්‍රාග්ධන වියදම් බදු කාලය අවසානයේදී ආපසු අයකර ගැනීමට ඔවුන් එකඟවී ඇත.

4. රාජ්‍ය භාෂා කොමිෂන් සභාව මෙම කාර්යාල පරිශ්‍රය බදු පදනම් මත දීර්ඝ කාලයක් භාවිතා කිරීමට අපේක්ෂා කරන බැවින් එහි සිදුකර ඇති කාර්යාල බෙදීම්වල සහ සේදුම් කාමරයේ ඵලදායී ආයු කාලය පිළිවෙලින් අවුරුදු 10 ක් සහ 20 ක් ලෙස තක්සේරු කර ඇත.

5. සභාපතිතුමා විසින් භාවිතා කරනු ලබන අංක CAQ 1997 දරණ වාහනය රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට පවරා ඇති බැවින් එහි වටිනාකම P.P.E. ට ඇතුළත් කර නොමැත.

6. අංක WP TF 9679 දරණ යතුරු පැදිය ධාවන තත්ත්වයේ නොපවතින බැවින් එහි සුන්බුන් අගය (Scrap Value) තක්සේරු කළ යුතුව ඇත. යතුරු පැදියේ සුන්බුන් අගය (Scrap Value) ගණනය කර දෙන ලෙසට ඉල්ලීම් ලිපිය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත යවා ඇත.

5. ගෙවිය යුතු

		2023	2022
		රු.	රු.
2841	- ලිපිද්‍රව්‍ය	41,125.00	7,300.00
2811	- වැටුප්	7,935.82	-
2844	- සූවත්පත්	166,770.00	3,870.00
	- ඉන්ධන දීමනා	39,223.99	
2866	- මෝටර් රථ අලුත්වැඩියා කිරීම්		17,680.00
2883	- දූරකථන බිල්පත්	42,179.80	33,018.06
2886	- පවිත්‍රතා සේවා	77,000.00	-
2887	- ආරක්ෂක සේවා	71,300.00	-
2464	- පරිගණක නඩත්තුකිරීම්		-
2861	- ගොඩනැගිලි නඩත්තුකිරීම්	2,694,806.03	1,799,639.22
2849	- වෙනත්		-
2815	- අතිකාල ගෙවීම්	7,890.37	11,234.73
2816	- නිවාඩු වෙනුවට ගෙවීම්		2,144.50
2540	- ගෙවිය යුතු තැන්පතු	55,636.22	250,463.22
	සේ.අ.අ. අධිභාර		-
2831	- ගමන් වියදම්		-
3302	- බඳවා ගැනීම් හා විභාග		-
2882	කුළී		1,821,000.00
	සේදුම් කාමරය	14,903.94	-
	විශේෂ අත්තිකාරම් වැඩිපුර අයකර ගැනීම්	2,800.00	
	විශේෂ අත්තිකාරම් පොලී වැඩිපුර අඩුකර ගැනීම්	102.76	
	කාර්යාලීය ගෘහභාණ්ඩ	27,830.00	
	වෙනත්	3,357.50	
	පොත් මුද්‍රණය කිරීම		287,500.00
3305	අධ්‍යක්ෂ මණ්ඩල වියදම්		-
	වෙනත්	450,000.00	
		3,702,861.43	**4,233,849.73**

2022 වර්ෂයේදී සේ.අ.අ. අධිභාර ලෙස රු. 71,511.24 ක මුදලක් රාජ්‍ය භාෂා කොමිෂන් සභාව විසින් ගෙවිය යුතුව තිබුණි. එම මුදලින් රු. 39,243.48 ක් අදාළ විෂය භාර නිලධාරියාගෙන් අයකර ගෙන ඇති අතර එය සේ.අ.අ. ගෙවා ඇත.

6. පාරිතෝෂිකසඳහා ප්‍රතිපාදන

	2023	2022
	රු.	රු.
ඉදිරියට ගෙන ආ ශේෂය		
වර්ෂය තුළ එකතු කිරීම්	4,395,671.17	3,952,612.77
වර්ෂය තුළ කරන ලද පාරිතෝෂික ගෙවීම්	1,131,901.33	443,058.40
පියවූම් ශේෂය	(188,595.00)	-
	5,338,977.50)	**4,395,671.17**

7. සමුච්චිත අරමුදල

	2023	2022
	රු.	රු.
පෙර වර්ෂයේ ගැලපීම්වලට පෙර ඉදිරියට ගෙනා ශේෂය	11,523,177.48	10,567,639.16
(-) පෙර වර්ෂයේ ශේෂ ගණනය කිරීමේදී සිදුවූ වරද නිවැරදි කිරීම	(0.01)	-
(-) සේවකයින්ට ලබාදෙන ණයවලට අදාළව පෙර වර්ෂයේ ශේෂය ගණනය කිරීමේදී සිදුවූ වරද නිවැරදි කිරීම	(17.99)	
(+) තැන්පතු ගිණුම් - ආරම්භක ශේෂයට ගැලපීම		0
ප්‍රාග්ධනවියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල්	2,000,000.00	2,300,000.00
අතිරික්තයට/(ඌණතාවයට) පෙර සමුච්චිත අරමුදල	13,523,159.48	12,867,639.16
වර්ෂය සඳහා අතිරික්තය/(ඌණතාවය)	(5,218,396.11)	(9,548,361.68)
මෝටර් රථ ප්‍රත්‍යාගණනය කිරීම		7,500,000.00

පරිගණක ප්‍රත්‍යාගණනය කිරීම		-
කාර්යාලීය ගෘහ භාණ්ඩ ප්‍රත්‍යාගණනය කිරීම		80,000.00
කාර්යාලීය ගෘහ භාණ්ඩ ප්‍රත්‍යාගණනය කිරීම		6,500.00
පිරියත හා යන්ත්‍රෝපකරණ ප්‍රත්‍යාගණනය කිරීම		-
උත්සව අත්තිකාරම් ශේෂයේ ආරම්භක ශේෂයට ගැලපීම		2,600.00
අස්පෘශ්‍ය වත්කම්වල (වෙබ් අඩවිය) ණය ශේෂයට ගැලපීම		614,800.00
නොපියවන ලද උප අග්‍රිම නිවැරදි කිරීම		
2023 වර්ෂයේදී කොමිෂන් සභාවට මාරු කරනු ලැබූ අධ්‍යක්ෂවරියට ගෙවන ලද විශේෂ අත්තිකාරම් මුදලින් ආපසු අයකර ගනු ලැබූ මුදලට ගැලපීම	800.00	
2022 වර්ෂයේදී ලැබුණු මාර්ගෝපදේශ පොත් තොගයේ වටිනාකමට ගැලපීම	287,500.00	
උප අග්‍රිම පියවීම නිවැරදි කිරීම	14.46	-
	8,593,077.83	**11,523,177.48**

8. අනිකුත් ආදායම්

	2023	2022
	රු.	රු.
සේවක ආපදා ණය - පොලී	138,356.80	158,695.65
විශේෂ අත්තිකාරම් - පොලී	359.66	6,165.60
	138,716.46	**164,861.25**

9. වැටුප්, වේතන සහ සේවකයින් සඳහා ප්‍රතිලාභ

	2023	2022
	රු.	රු.
2811 - වැටුප් සහ වේතන		
2812 - සේවක අර්ථසාධක අරමුලේ දායකත්වය - 12%	10,221,940.61	10,803,665.15
2813 - සේවා නියුක්තයින්ගේ භාර අරමුලේ දායකත්වය - 3%	1,442,161.30	1,552,695.88
2815 - අතිකාල	366,902.20	385,820.61
2817 - නිවාඩු වෙනුවට ගෙවීම්	166,906.35	251,590.85
2817 - වැටුප් දීමනා	8,752.25	26,742.14
2814 - පාරිතෝෂික වියදම්	3,203,976.97	3,336,532.11
2814 - විශ්‍රාම දායකත්ව ගෙවීම්	1,131,901.33	443,058.40
3303 - කාර්යමණ්ඩලය පුහුණු කිරීම්	54,819.00	-
	57,944.11	
	16,655,304.12	**16,800,105.14**

10. සැපයුම් සහ පාවිච්චි කරන ලද පරිභෝජ්‍ය භාණ්ඩ

	2023	2022
	රු.	රු.
2841 - ලිපිද්‍රව්‍ය	517,074.69	569,707.39
2843 - නිල අඳුම්	20,000.00	34,150.00
2844 - පුවත්පත් සහ වාර සඟරා	190,235.00	399,356.19
2851 - ඉන්ධන සහ ලිහිසි තෙල්	1,085,889.47	831,035.00
2842 - සැපයුම් - පරිභෝජ්‍ය	83,200.00	25,400.00
2849 - වෙනත්	153,836.30	353,186.30
	2,050,235.46	**1,912,834.88**

11. අලුත්වැඩියා සහ නඩත්තු කිරීම්

	2023	2022
	රු.	රු.
2862 - කාර්යාලීය උපකරණ නඩත්තු කිරීම්	151,106.94	457,701.16
2864 - පරිගණක නඩත්තු කිරීම්	118,454.44	571,891.19
2866 - මෝටර් රථ නඩත්තු කිරීම්	985,302.00	465,984.68
2865 - වායුසමීකරණ යන්ත්‍ර නඩත්තුකිරීම්	-	-
2861 - ගොඩනැගිලි නඩත්තු කිරීම්	3,437,213.58	1,568,687.15
2852 - රක්ෂණ සහ බලපත්	210,113.89	197,198.79
	4,902,190.85	**3,262,062.97**

12. උපයෝග සහ අනිකුත් සේවාවන්

	2023	2022
	රු.	රු.
2883 - දූරකථන සහඅන්තර්ජාල	446,672.08	445,979.35
2882 - ගොඩනැගිලි කුලී	7,284,000.00	7,284,000.00
2887 - ආරක්ෂක සේවාවන්	800,011.23	1,167,779.96
2886 - පවිත්‍රතා සේවාවන්	909,900.00	768,023.40
2888 - තැපැල් ගාස්තු	124,335.00	55,850.00
	9,564,918.31	**9,721,632.71**

13. අනිකුත් වියදම්

	2023	2022
	රු.	රු.
3302 - බඳවාගැනීම් සහ විභාග	222,669.57	477,086.94
පරිත්‍යාග කරන ලද පොත් සඳහා වියදම	176,920.00	45.00
3010 - දැන්වීම් ප්‍රචාරය කිරීම	2,890.00	-
2831 - ගමන් වියදම් - දේශීය	16,140.00	66,684.00
2853 - වාහන කුලියට ගැනීමේ වියදම්	96,963.00	2,500.00
2859 - අනිකුත් ප්‍රවාහන	50,000.00	-
	565,582.57	**546,315.94**

14. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

	2023	2022
	රු.	රු.
3050 - වැඩමුළු සහ සම්මන්ත්‍රණ	471,489.98	839,675.01
3305 - අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වියදම්	617,250.22	515,248.00
3309 - වෙනත් (උපායමාර්ගික සැලැස්ම වැඩිදියුණු කිරීම)	450,000.00	-
3070 - වෙනත්	128,290.50	22,278.50
3041 - විගණන කමිටු වියදම්	149,431.80	34,250.00
3042 - මුද්‍රණය කිරීම්	71,510.00	288,100.00
3040 - පොත් මුද්‍රණය කිරීම්	5,380.00	293,040.00
3033 - ක්ෂේත්‍ර ගමන් බිමන්	429,380.00	14,750.00
	2,322,732.50	**2,007,341.51**

15. ආපදා ණය සහ අයවිය යුතු පොලී

	2023	2022
	රු.	රු.
ආපදා ණය - අයවිය යුතු පොලී	-	1,469.60
විශේෂ අත්තකාරම් - අයවිය යුතු පොලී	-	734.00
	-	**2,203.60**

අවසන් ගිණුම් සඳහා කටයුතු කිරීම

2841 - ලිපිද්‍රව්‍ය

2023.01.01 දිනට ලිපිද්‍රව්‍ය (තොග)	1,294,648.70
මිළදී ගැනීම්	568,293.76
	1,862,942.46
2023.12.31 දිනට ලිපිද්‍රව්‍ය (තොග)	1,345,867.77
පරිභෝජ්‍ය භාණ්ඩවල පිරිවැය	**517,074.69**

ගෙවිය යුතු - සඳහා ගැලපුම් සටහන්

වියදම	මුදලින් කරන ලද ගෙවීම්	[+] 2023 වර්ෂය සඳහා ගෙවිය යුතු	[-] 2022 වර්ෂය සඳහා ගෙවිය යුතු	[-] පෙර ගෙවීම් 2023	[+] පෙර ගෙවීම් 2022	2022 වර්ෂය සඳහා වියදම
2841 - ලිපිද්‍රව්‍ය	534,468.76	41,125.00	7,300.00			568,293.76
..... - ඉන්ධන සහ ලිහිසි තෙල්	1,046,665.48	39,223.99				1,085,889.47
2811 - වැටුප් සහ වේතන	10,478,151.51	7,935.82				10,486.087.33
2883 - දූරකථන සහ අන්තර්ජාල බිල්පත්	444,593.71	42,179.80	33,018.06			453,755.45
2886 - පවිත්‍රතා සේවා	832,900.00	77,000.00				909,900.00
2887 - ආරක්ෂක සේවා	728,711.23	71,300.00				800,011.23
2888 - කැපැල් ගෑස්කු	112,260.00				12,075.00	124,335.00
2849 - වෙනත්	153,836.30					153,836.30
2882 - කුළී	9,105,000.00		1,821,000.00			7,284,000.00
3042 - මුද්‍රණ	71,510.00					71,510.00
2844 - පුවත්පත්	27,335.00	166,770.00	3,870.00			190,235.00
2831 - ගමන් වියදම්	16,140.00					16,140.00
2815 - අනිකාල	170,250.71	7,890.37	11,234.73			166,906.35
2816 - නිවාඩු වෙනුවට ගෙවීම්	10,896.75		2,144.50			8,752.25
2852 - රක්ෂණ සහ බලපත්‍ර	210,113.89					210,113.89
2862 - කාර්යාලීය උපකරණ නඩත්තු කිරීම්	158,734.65			39,905.15	32,277.44	151,106.94
2861 - ගොඩනැගිලි නඩත්තු කිරීම්	2,542,046.77	2,694,806.03	1,799,639.22			3,437,213.58
2864 - පරිගණක නඩත්තු කිරීම්	90,279.44				28,175.00	118,454.44
2866 - මෝටර් රථ අලුත්වැඩියා කිරීම් සහ නඩත්තු කිරීම්	1,002,982.00		17,680.00			985,302.00
3302 - බඳවා ගැනීම් හා විභාග	222,669.57					222,669.57
3305 - අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්	617,250.22					617,250.00
3040 - පොත් මුද්‍රණය කිරීම්	292,880.00		287,500.00			5,380.00
..... - වෙනත්	-	450,000.00				450,000.00
.....	124,933.00	3,357.50				128,290.50

වැටුප් සහ වේතන

ගෙවිය යුතු සහ පෙර ගෙවීම්වලින් පසුව **2023** වර්ෂය සඳහා වියදම	10,486,087.33
(-) වැටුප් අධිභාර	(264,146.72)
ගෙවිය යුතු සහ පෙර ගෙවීම්වලින් පසුව **2022** වර්ෂය සඳහා වියදම	10,221,940.61

උපඅග්‍රිම ගිණුම

ආරම්භක ශේෂය	3.00
(+) රාජ්‍ය නිලධාරීන් සඳහා උපඅග්‍රිම	1,757,795.00
(-) උපඅග්‍රිම පියවීම *	1,757,798.00
පියැවුම් ශේෂය	**1,757,798.00**

මුදල් පොකේ වැරදි ලෙස පියවන ලද මුදල ගැලපීම
812.46 – 14.46 = 1,757,798.00)

පරිභෝජ්‍ය ගිණුම	
2842 - පරිභෝජ්‍ය	83,200.00
2840 - සැපයුම්	
2023 වර්ෂය සඳහා මුදලින් වියදම	**83,200.00**

විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන	
ඉදිරිය ගෙන ආ ශේෂය	172,414.00
(+) 2022 වර්ෂය තුළ එකතු කිරීම්	250,000.00
	422,414.00
(-) 2023 වර්ෂය තුළ ගෙවන ලද විගණන ගාස්තු	289,800.00
2023.12.31 දිනට ශේෂය	**132,614.00**

කැන්පතු		
2023.01.01 දිනට ආරම්භක ශේෂය	250,463.22	
2660 - වර්ෂය තුළ ලද ගෙවිය යුතු කැන්පතු		
(-) වර්ෂය තුළ සිදුකරන ලද කැන්පතු ගෙවීම්	137,171.90	
	387,635.12	
වර්ෂය තුළ සිදුකරන ලද කැන්පතු ගෙවීම්	331,998.90	
2023.12.31 දිනට ගෙවිය යුතු කැන්පතුවල ශේෂය		**55,636.22**

ආරම්භක ශේෂය නිවැරදි කිරීම පිණිස රු. **1,725.00** ක මුදලක් ගලපන ලදි.

පරිත්‍යාග කරන ලද පොත්

සිංහල පදමාලා	26,300.00
ඉංග්‍රීසි පදමාලා	9,045.00
දෙමළ විශේෂ පදමාලා	-
පැය **40** කෙටිකාලීන පාඨමාලා පොත	72,000.00
මාර්ගෝපදේශ පොත	69,575.00
	176,920.00

ක්ෂය කිරීම්

පරිගණක

	පිරිවැය	25% ක්ෂය කිරීම
2023.01.01 දිනට ආරම්භක ශේෂය	2,500,600.00	
2019 වර්ෂයේදී මිළදී ගත් අයිතමවල සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වටිනාකම්	1,376,850.00	-
ක්ෂය කළහැකි පිරිවැයේ ශේෂය	3,877,450.00	969,362.50
එකතුව	**3,877,450.00**	**969,362.50**

(I) රු. 1,376,850.00 ක වටිනාකමින් යුත් පරිගණක සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති අතර ඒවා ප්‍රත්‍යාගණනය කළ යුතුය

මෝටර් රථ

	පිරිවැය	25% ක් ක්ෂය කිරීම
2023.01.01 දිජට ආරම්භක ශේෂය	7,500,000.00	
සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද අගය	(7,500,000.00)	
ක්ෂය කළ හැකි පිරිවැයේ ශේෂය	-	-
ප්‍රත්‍යාගණනය කිරීම්		
අංක NB-3467 දරණ වෑන් රථය	7,500,000.00	1,875,000.00
එකතුව	**7,500,000.00**	**1,875,000.00**

(I) අංක WP CAQ 1997 දරණ මෝටර් රථය රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට පවරා ඇත.

(II) අංක WP TF 9679 දරණ යතුරු පැදිය ධාවන තත්ත්වයේ නොපවතින බැවින් එහි සුන්බුන් අගය (Scrap Value) තක්සේරු කළ යුතුව ඇත. යතුරු පැදියේ සුන්බුන් අගය (Scrap Value) ගණනය කර දෙන ලෙසට ඉල්ලීම් ලිපිය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත යවා ඇත.

කාර්යාලීය ගෘහභාණ්ඩ

	පිරිවැය	10% ක් ක්ෂය කිරීම
2023.01.01 දිනට ආරම්භක ශේෂය	6,234,004.05	623,400.41
(+) 2023.12.20 වෙනි දින මිළදී ගන්නා ලද අයිතම	27,830.00	
සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද සහ ප්‍රත්‍යාගණනය කිරීම්	(70,000.00)	
එකතුව	**6,234,004.05**	**623,400.41**

කාර්යාලීය උපකරණ

	පිරිවැය	10% ක් ක්ෂය කිරීම
2023.01.01 දිනට ආරම්භක ශේෂය	882,655.48	88,265.55
(+) 2023.02.16 වෙනි දින මිළදී ගන්නා ලද අයිතම	10,950.00	958.13
2023.04.18 වෙනි දින මිළදී ගන්නා ලද අයිතම	26,750.00	1,894.79
2023.09.05 වෙනි දින මිළදී ගන්නා ලද අයිතම	95,000.00	3,166.67
එකතුව	**1,015,355.48**	**94,285.13**

පිරියන සහ යන්ත්‍රෝපකරණ

	පිරිවැය	10% ක් ක්ෂය කිරීම
2023.01.01 දිනට ආරම්භක ශේෂය	108,500.00	21,700.00
එකතුව	**108,500.00**	**21,700.00**

ගොඩනැගිලි සහ ව්‍යුහයන්

	පිරිවැය	10% ක් ක්ෂය කිරීම
කාර්යාලීය බෙදීම්		
2023.01.01 දිනට ආරම්භක ශේෂය	2,996,296.25	299,629.63
එකතුව	**2,996,296.25**	**299,629.63**

ආපසු අයකර ගැනීමේ පදනම මත අත්පත් කරගන්නා ලද වත්කම්

	පිරිවැය	10% ක් ක්ෂය කිරීම
සේදුම් කාමරය		
2023.01.01 දිනට ආරම්භක ශේෂය	993,596.00	49,679.80
(+) 2023.12.31 දිනට අගය එකතු කිරීම	14,903.94	-
එකතුව	**1,008,499.94**	**49,679.80**

මෙම කාර්යාල පරිශ්‍රය රාජ්‍ය භාෂා කොමිෂන් සභාව විසින් දීර්ඝකාලීනව කුලී පදනම මත භාවිතා කිරීමට අපේක්ෂා කරන බැවින් මෙම අභ්‍යන්තර කාර්යාලීය බෙදීම්වල ඵලදායී ආයු කාලය අවුරුදු 10 කට තක්සේරු කර ඇත.

අස්පෘශ්‍ය වත්කම් - වෙබ් අඩවිය

	පිරිවැය	10% ක් ක්ෂය කිරීම
2023.01.01 දිනට ආරම්භක ශේෂය	614,800.00	61,480.00
එකතුව	**614,800.00**	**61,480.00**

ආපදා ණය උපලේඛනය

	නම	2023.01.01 දිනට ශේෂය (රු.)	2023 වර්ෂය තුළදී ලබාදුන් ණය මුදල (රු.)	ණය මුදල ලබාදුන් වැය ශීර්ෂය	2023 වර්ෂය තුළදී ප්‍රාග්ධන අයකර ගැනීම්	2023.12.31 දිනට ශේෂය (රු.)
1	ජී.ඒ.ඩී.ඩී. ගනේපොල	243,160.00	54,580.00	2331	52,080.00	245,660.00
2	ඩබ්ලිව්.ඩී.පී. පුෂ්පකුමාර	206,480.37			40,332.00	166,148.37
3	එල්.ජී.එස්. ගාමිණී	217,500.00	60,000.00	2331	30,000.00	247,500.00
4	එම්.ඒ.එල්.එම්. රමීස්	36,101.58			27,258.00	8,843.58
5	එච්.පී.ඒ. ප්‍රේමලාල්	132,910,02			29,016.00	103,894.02
6	පී.ඒ.ආර්. නිලන්ත	247,500.00	34,554.00	2331	34,968.00	247,086.00
7	ඒ.එන්. ඉපලවක්ත	131,139.70			30,000.00	101,139.70
8	එස්.පී. කරුණාසේන	217,500.80	62,499.20	2331	30,000.00	250,000.00
9	පී.එස්.ජී. කුමාරි	245,000.00			36,372.00	208,628.00
10	ඩී.කේ. ආරව්වී	244,469.00	38,871.68	2331	36,372.00	246,968.68
11	ඩබ්ලිව්.කේ. ප්‍රියන්ත	163,026.00			30,000.00	133,026.00
12	ඒ.ඩී.ඩී.එන්. නන්දසේන	192,443.58	92,556.42	2331	35,000.00	250,000.00
13	එස්. මධිවානන්	105,000.00			30,000.00	75,000.00
14	ඒ.එම්.ජී.යූ. අබේකෝන්	142,500.00			30,000.00	112,500.00
15	ජේ.පී.එස්. කුමාර්	217,500.00			30,000.00	187,500.00
16	එච්.පී.එස්. සංගීත්	238,125.00	39,925.00	2331	30,000.00	247,450.00
17	පී. යැෂ්මිනි	243,588.50			46,938.00	196,650.50
18	එන්.කේ.එන්. අමාලි	192,500.00			192,500.00	-
19	ජේ.එම්. නිරෝජා	242,119.00	39,572.00	2331	34,572.00	247,119.00
20	ඌෂා දර්ශනී	243,588.50			243,588.00	-
21	කේ.එච්.එස්. ක්‍රිෂාන්ති	70,564.00	70,564.00	2331	197,710.00	52,290.00
	එකතුව	**3,972,716.05**			**1,247,306.50**	**3,275,113.85**

පිළියෙළ කළේ :

පරීක්ෂා කළේ :

ප්‍රාග්ධන වියදම් සඳහා රජයෙන් ලද ප්‍රදානයන්

2022.01.01 දිනට ශේෂය	**(199,785.72)**
2023 වර්ෂයේදී ප්‍රාග්ධන වියදම් සඳහා රජයෙන් ලද ප්‍රදානයන්	2,000,000.00
	1,800,214.28
2023 වර්ෂයේදී ප්‍රාග්ධන වියදම්	(175,433.94)
2023.12.31 දිනට ශේෂය	**1,624,780.34**

පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලද ප්‍රදානයන්

2023.01.01 දිනට ශේෂය	1,275,267.12
(+) 2023 වර්ෂයේදී පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලද ප්‍රදානයන්	34,814,000.00
	36,089,267.12
(-) 2023 වර්ෂය තුළ පුනරාවර්තන වියදම්	**36,234,161.25**
(-) සේවකයින්ට ලබාදෙන ලද ණය සහ අත්තිකාරම්	763,994.30
2023.12.31 දිනට ශේෂය	**(908,888.43)**
(+) වෙනත් - මුදලින් ලද	**3,962,791.47**
2023.12.31 දිනට මුදල් ශේෂය	3,053,903.04

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව
2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම

			2023
2600	ආදායම	-	134,388.70
2610	රජයේ ප්‍රදානයන් - ප්‍රාග්ධන	-	2,000,000.00
2620	රජයේ ප්‍රදානයන් - පුනරාවර්තන	-	34,814,000.00
2675	වැඩිපුර ගෙවීම්		71,388.57
2675	ණය වාරික (උත්සව)	-	128,754.00
2690	ණය වාරික (ආපදා)	-	1,247,306.50
2334	ණය වාරික (විශේෂ අත්තිකාරම්)	-	35,600.00
	වැඩිපුර ගෙවීම් (සේවකයින්ගෙන් අධිභාර)		192,758.15
2680	ණය පොලී	-	139,826.40
2334	විශේෂ අත්තිකාරම් පොලී	-	1,196.42
2700	උප අග්‍රිම පියවීම	-	1,757,812.46
	ගෙවිය යුතු තැන්පතු		128,443.90
	වැටුප් අධිභාර (වැටුප් රහිත)	-	
	ගෙවිය යුතු මුද්දර ගාස්තු		6,650.00
2811	අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද		2,078.00
	වැඩිපුර ගෙවීම් - දුරකථන		7,083.37
	2023.01.01 දිනට දේපළ, පිරියත සහ උපකරණ		
2200	පිරියත සහ යන්ත්‍රෝපකරණ	108,500.00	-
2201	ගොඩනැගිලි සහ ව්‍යුහයන්	2,996,296.25	-
	සේදුම් කාමරය	996,596.00	-
2203	කාර්යාලීය ගෘහ භාණ්ඩ	6,234,004.05	-
2202	කාර්යාලීය උපකරණ	882.655.48	-
2204	පරිගණක	2,500,600.00	-
2206	මෝටර් රථ	7,500,000.00	-
2203	අස්පෘශ්‍ය වත්කම් (වෙබ් අඩවිය)	614,800.00	-
	භාණ්ඩ ලේඛන	292,855.00	-
	පෙර ගෙවීම්	72,577.44	
	අයවිය යුතු ආපදා ණය පොලී	2,203.60	
	උත්සව අත්තිකාරම්	8,754.00	

	2023.01.01 දිනට ක්ෂය කිරීම් සඳහා ප්‍රතිපාදන		-
	පිරියත සහ යන්ත්‍රෝපකරණ	-	43,400.00
	කාර්යාලීය ගෘහ භාණ්ඩ	-	3,674,112.29
	ගොඩනැගිලි සහ ව්‍යුහයන්	-	358,233.68
	සේදුම් කාමරය		4,139.98
	කාර්යාලීය උපකරණ	-	221,519.44
	මෝටර් රථ	-	1,875,000.00
	පරිගණක	-	2,115,882.92
	අස්පෘශ්‍ය වත්කම් (වෙබ් අඩවිය)	-	61,480.00
	2023 වර්ෂය සඳහා ක්ෂය කිරීම්	-	-
2207	ඉන්වෙන්ට්‍රි අයිතම		-
2208	අනිකුත් වත්කම්	95,000.00	-
2310	භාණ්ඩ ලේඛන	26,750.00	-
2312	ලිපිද්‍රව්‍ය	3,500.00	-
	2023.01.01 දිනට නොපියවන ලද උප අග්‍රිම	3.00	-
	2023.01.01 දිනට ලිපිද්‍රව්‍ය තොග	1,294,648.70	-
	2023.01.01 දිනට සේවකයින්ට ලබාදෙන ණය	3,902,170.04	-
2311	ආපදා ණය	601,994.30	-
2334	විශේෂ අත්තිකාරම්	32,000.00	-
2332	උත්සව අත්තිකාරම්	130,000.00	-
2342	අත්තිකාරම්	1,757,795.00	-
2400	2023.01.01 දිනට සමුච්චිත අරමුදල	-	11,523,177.48
	2023.01.01 දිනට පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	-	4,395,671.17
	2023.01.01 දිනට විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන	-	172,414.00
2201	ගොඩනැගිලි හා ව්‍යුහයන්		-
2202	කාර්යාලීය උපකරණ	10,950.00	-
2811	වැටුප් සහ වේතන	10,478,151.51	-
2812	සේවක අර්ථසාධක අරමුදල (EPF)	1,442,161.30	-
2813	සේවා නියුක්තයින්ගේ භාර අරමුදල (ETF)	366,902.20	-
2814	විශ්‍රාම දායක මුදල්	54,819.00	
2814	පාරිතෝෂික ගෙවීම්	188,595.00	
2815	අතිකාල	170,250.71	-
2816	නිවාඩු දින වැටුප්	.....	-
2817	දීමනා	3,203,976.97	-
2831	ගමන් වියදම් - දේශීය	16,140.00	-
2840	සැපයුම්	-	-
2841	ලිපිද්‍රව්‍ය	530,968.76	-
2842	පරිභෝජ්‍ය	83,200.00	-
2843	නිල ඇඳුම්	20,000.00	-
2844	පුවත්පත් සහ වාර සඟරා	27,335.00	-
2849	වෙනත්	153,836.30	-
2851	ඉන්ධන සහ ලිහිසි තෙල්	1,046,665.48	-

2852	රක්ෂණ සහ බලපත්	210,113.89	-
2853	වාහන කුලියට ගැනීමේ ගාස්තු	96,963.00	-
2859	වෙනත් - ප්‍රවාහන	50,000.00	-
2861	ගොඩනැගිලි		-
2862	කාර්යාලීය උපකරණ නඩත්තු කිරීම්	158,734.65	-
2864	පරිගණක නඩත්තු කිරීම්	90,279.44	-
2865	වායුසමීකරණ යන්ත්‍ර නඩත්තු කිරීම්	-	-
2866	මෝටර් රථ නඩත්තු කරීම්	1,002,982.00	-
2882	කුලී	9,105,000.00	-
2883	දුරකථන සහ අන්තර්ජාල	444,593.71	-
2884	උපයෝගිතා ගෙවීම්	2,542,046.77	
2886	පවිත්‍රතා සේවා	832,900.00	-
2887	ආරක්ෂක සේවා	728,711.23	-
2888	තැපැල් ගාස්තු	112,260.00	-
3010	දැන්වීම් ප්‍රචාරණය කිරීම්	2,890.00	
3033	ක්ෂේත්‍ර ගමන් බිමන්	429,380.00	
3040	පොත් මුද්‍රණය කිරීම්	292,880.00	-
3041	විගණන කමිටු වියදම්	149,431.80	-
3042	මුද්‍රණ	71,510.00	-
3050	වැඩමුළු සහ සම්මන්ත්‍රණ	471,489.98	-
3070	වෙනත්	124,933.00	-
3302	බඳවා ගැනීම් සහ විභාග	222,669.57	-
3304	කාර්යමණ්ඩලය පුහුණු කිරීම්	57,944.11	
3305	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වියදම්	617,250.22	-
2899	විගණන ගාස්තු	289,800.00	-
2540	අයවිය යුතු සහ ගෙවිය යුතු තැන්පතු	331,998.00	
	මුදල් සහ බැංකු ශේෂය	3,053,903.04	-
	2023.01.01 දිනට ගෙවිය යුතු		-
	ලිපිද්‍රව්‍ය (2841)	-	7,300.00
	වැටුප් සහ වේතන	-	
	දුකථන සහ අන්තර්ජාල (2883)	-	33,018.00
	තැන්පතු	-	-
	පෙර ගෙවීම් - කර්යාල උපකරණ නඩත්තුව (2862)		-
	ගෙවිය යුතු දුරකථන බිල්පත්	-	-
	පවිත්‍රතා සේවා	-	
	ආරක්ෂක සේවා	-	
	ප්‍රවත්පත්		3,870.00
	මෝටර් රථ අළුත්වැඩියා කිරීම්		17,680.00
	කුලී	-	1,821,000.00
2540	ගෙවිය යුතු තැන්පතු -	-	250,463.22
	පොත් මුද්‍රණය කිරීම (3040)	-	287,500.00
	ගමන් වියදම් (2831)	-	

	බඳවා ගැනීම් සහ විභාග (3302)	-	
	ගොඩනැගිලි (2201)	-	
	ගෙවිය යුතු අතිකාල	-	11,234.73
	නිවාඩු දින වෙනුවට ගෙවීම් (2816)		2,144.50
	ගෙවිය යුතු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වියදම්	-	
	ගෙවිය යුතු ගොඩනැගිලි නඩත්තු කිරීමේ වියදම්	-	1,799,639.22
	ගෙවිය යුතු පරිගණක නඩත්තු කිරීමේ වියදම්	-	-
	අයකරගත යුතු ආපදා ණය	-	-
	ආරම්භක ශේෂය ගැලපීමේ ගිණුම	0.01	
	එකතුව	**69,346,167.16**	**69,346,167.16**

IV වන කොටස

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. PAF/C/OLC/FS/1/23/04 මෙහි අංකය உமது இல. Your No. දිනය திகதி Date 2024 මැයි 31 දින

සභාපති

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 49 වගන්තිය ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කිරීමේදී එම වත්කම අයත් වන වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත්, පිරිවැය රු.6,234,004 ක් වූ කාර්යාල ලී බඩු අතරින් රු.70,000ක් වූ කබඩ් පමණක් ප්‍රත්‍යාගණනය කර තිබූ අතර, මුළු පිරිවැය රු.882,655 ක් වූ කාර්යාල උපකරණ අතරින් රු.8,850ක් වූ ස්කෑන් යන්ත්‍රය පමණක් පසුගිය වර්ෂයේ ප්‍රත්‍යාගණනය කිරීම සමාලෝචිත වර්ෂයේදී ද නිවැරදි කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවලට ගළපා තිබූ ක්ෂය වටිනාකම රු.3,994,537 ක් වුවද, විගණනයේදී ගණනය කිරීම් අනුව ක්ෂය වටිනාකම රු.3,306,501 ක් වූයෙන් මූල්‍ය ප්‍රකාශනවල ක්ෂයවීම් රු.688,036 ක් වැඩියෙන් දක්වා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට මුළු පිරිවැය රු2,500,600 ක් වූ පරිගණක වටිනාකමෙන් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ රු.1,376,850 ක පරිගණක වටිනාකම් ඉවත් කර ක්ෂය ගණනය කරනු වෙනුවට එම වටිනාකම් එකතු කර ක්ෂය ගණනය කිරීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට පරිගණකවල සමුච්චිත ක්ෂය වටිනාකම රු. 3,085,245 ක් වූ අතර පිරිවැය රු. 2,500,600 ක් වූයෙන් පරිගණකවල වටිනාකම් සෘණ අගයක් නිරීක්ෂණය විය.

(ඇ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 20 වන වගන්තිය පාරිතෝෂික වෙන්කිරීම් ගණනය කිරීමේදී ගණුන් නොගත යුතු දූරකථන දීමනාව, භාෂා දීමනාව හා විධායක දීමනාව ඇතුළත්ව ගණනය කර තිබුණ අතර ස්ථිර සේවකයන් තුන්දෙනෙකු සඳහා පාරිතෝෂික වෙන් කිරීම සිදු කර නොතිබුණි. එම වැඩියෙන් හා අඩුවෙන් වෙන් කිරීම් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී පාරිතෝෂිත වෙන් කිරීම් රු.182,345ක් අඩුවෙන් සිදුකර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ජාතික භාෂා සමානාත්මතා අභිවර්ධන ව්‍යාපෘතියෙන් ලද වත්කම් අයිතම 15ක් හා නවෝත්පාදන මධ්‍යස්ථානයෙන් ලද වැබ් පරිගණක 05 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කොමිෂන් සභාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් කොමිෂන් සභාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැළපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ

අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිෂන් සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2.2 (අ) හි දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති විධිවිධානයට යොමුව	නිරීක්ෂණ
(අ)	1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතේ13(3) වගන්තිය	සභාපතිවරයා කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා වුවද, ඔහු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු නොවිය යුතු වුවත් 2023 මාර්තු 13 දින සිට 2023 ඔක්තෝම්බර් 26 දක්වා කොමිසම් සභාවේ සියළු ගෙවීම් සඳහා වියදම් සහතික කිරීම සභාපතිවරයා විසින් සිදු කර තිබුණි.
(ආ)	2022 අප්‍රේල් 26 දිනැති අංක 3/2022 දරන ජාතික අයවැය වක්‍රලේඛය	ජාතික අයවැය වක්‍රලේඛයට අනුව රජයේ කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම නැවැත්විය යුතු වුවද කොමිසම විසින් වාර්ෂික රු.7,284,000 ක බදු මුදලකට කාර්යාල ගොඩනැගිල්ලක් කුලියට ගෙන තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) පසුගිය වර්ෂයේ නොගෙවූ රු.1,563,402 ක ගොඩනැගිලි නඩත්තු වියදම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලද මුදලින් රු.832,846ක් පුනරාවර්තන වියදම් සඳහා යොදාගෙන තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති